වාර්ෂික වාර්තාව 2017

SLAASMB

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

*ඉහළ විශ්වාසනීයත්වයක් උදෙසා*

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්* විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ.
* (54 පිටුව බලන්න)

# පටුන


මණ්ඩලයේ සාමාජිකයින් ... 01

2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සාමාජිකයින් ... 02

මණ්ඩලයේ ආරාධිතයින් ... 05

කාර්ය මණ්ඩලය ... 06

තාක්ෂණික කාර්ය මණ්ඩලය ... 07

ක්‍රියාකාරකම් සමාලෝචනය ... 08

2017 වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ නිරීක්ෂණ ... 15

2017 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන් ... 17

2017 වර්ෂය තුළ විගණන පරීක්ෂණයේ නිරීක්ෂණ ... 19

කාර්යය සාධන ලකුණු පත ... 24

2017 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBE's) ලැයිස්තුව ... 26

2017 වර්ෂයේදී සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන අතරින් නිරීක්ෂණ සහිතව අනුකූල වූ, උපකාර ලිපි මගින් දැනුම් දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBE's) ලැයිස්තුව ... 31

2017 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන ලද ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය අංශයේ ආයතන ... 34

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරන ලද ප්‍රමිත සකස් කිරීම හා බැඳුනු ක්‍රියාකාරකම් ... 35

විගණකාධිපති වාර්තාව ... 36

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ... 42

මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය ... 43

ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය ... 44

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ... 45

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ... 46

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ... 54

# මණ්ඩලයේ සාමාජිකයින්

| | | |
|---|---|---|
| **ආර් ඒ ඒ ජයලත්** *FCA, BCom (Sp), MBA, MA Econ*<br>සහකාර අධිපති - ශ්‍රී ලංකා මහ බැංකුව | සභාපති<br>(2017 ජූනි 15 දින සිට) | |
| **ඩී එන් ආර් සිරිවර්ධන** *BA (Hons.), LLB, Attorney-at-Law*<br>සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් | නිල බලයෙන් | |
| **ඩී එම් එල් අයි දිසානායක** *BSc (Sp)(B. Admin)*<br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - කොමසාරිස් ජනරාල්<br><br>**කේ දහනායක මිය** *BCom (Sp), PGDM, M.pub.mgp., FTII*<br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - කොමසාරිස් ජනරාල් | නිල බලයෙන්<br>(2017 ජූනි 30 දින සිට)<br><br><br>(2017 ජූනි 22 දින දක්වා) | |
| **වී පී විජේගුණවර්ධන** *BA(Hons) MA*<br>ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - අධ්‍යක්ෂ ජනරාල් | නිල බලයෙන් | |
| **එල් එල් එස් වික්‍රමසිංහ** *FCA, FMAAT*<br>හවුල්කරු, බී. ආර් ද සිල්වා සහ සමාගම<br>හිටපු සභාපති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | පත් කල සාමාජික | ශ්‍රී.ලං.ව.ග.ආ. |
| **ඒ හේරත්** *FCA, BSc, MBA, MAFE*<br>හවුල්කරු, අර්නස්ට් සහ යංග් | පත් කල සාමාජික | ශ්‍රී.ලං.ව.ග.ආ. |
| **ඩබ් ඩබ් ජේ සී පෙරේරා** *FCA, BSc (B.Admin), CFE*<br>හවුල්කරු, කේ පී එම් ජී<br>සභාපති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | පත් කල සාමාජික | ශ්‍රී.ලං.ව.ග.ආ. |
| **එස් එන් ජයසිංහ** *FCMA(UK)*<br>සමූහ මූල්‍ය අධ්‍යක්ෂ, සිලෝන් බිස්කට් සමූහ සමාගම | පත් කල සාමාජික | එක්සත් රාජධානියේ වරලත් කලමනාකරන ගණකාධිකාරීන්ගේ ආයතනය (ශ්‍රී ලංකා) |
| **පී එල් සී පීරිස්** *FCA, Attorney-at-Law*<br>පාලන හවුල්කරු, පී එල් සී ලෝ චේම්බර්ස් | පත් කල සාමාජික | ශ්‍රී ලංකා නීතිඥ සංගමය |
| **එන් සිවප්‍රගාසම් මෙනෙවිය** *FCA, FCMA (UK)*<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී, එයිට්කන් ස්පෙන්ස් සමාගම | පත් කල සාමාජික | ලංකා වාණිජ මණ්ඩලය |
| **ඒ ඩී වාස් ගුණසේකර** *FCA, FSCMA*<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය, සම්පත් බැංකුව | පත් කල සාමාජික | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය |
| **එම් ඩී ජී එල් පෙරේරා මිය** *FCA, MBA*<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය | මණ්ඩලයේ ලේකම් | |

✷ ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ මණ්ඩල සම්මේලනය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නියෝජනය කරන සාමාජිකයින් දෙදෙනෙකු මණ්ඩලයට පත්කිරීමට නියමිතව ඇත.

# මණ්ඩලයේ සාමාජිකයින්
## 2017 දෙසැම්බර් 31 දිනට



**ආර් ඒ ඒ ජයලත්**
***BCom (Sp), MBA, MAEcon, FCA***

2017 ජුනි මස 15 දින සිට මණ්ඩලයේ සභාපති වශයෙන් පත්වූ ජයලත් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අන්තර් ජාතික මෙහෙයුම්, දේශීය මෙහෙයුම්, ගෙවීම් සහ බේරුම් කිරීම් සහ තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධානත්වය දරන සහකාර අධිපතිවරයාය. ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ෂ 28 කට වඩා වැඩි කාලයක් සේවයේ නියුක්තව සිටී.



**ඩී එන් ආර් සිරිවර්ධන**
***BA (Hons), LLB, Attorney-at-Law***

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස කටයුතු කරන සිරිවර්ධන මහතා සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ වසර 28 කට අධික කාලයක් සේවයකර ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත්වූ පාලක සභා සාමාජිකයකු වශයෙන්ද කටයුතු කරනු ලැබේ.



**ඩී එම් එල් අයි දිසානායක මහතා**
***BSc(Sp) Business Administration***

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දිසානායක මහතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වර්ෂ 34 කට වඩා වැඩි කාලයක් සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජිකත්වය දරණ අතර එහි පාලක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරනු ලැබේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික සහතික පත්‍රලාභියෙකි.



**වී පී විජේගුණවර්ධන**
***BA(Hons), MA***

විජේගුණවර්ධන මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා ලෙස කටයුතු කරනු ලබන අතර ඔහු ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධනය හා පාලනය සඳහා වූ ජාතික ආර්ථික අභිලාෂයන් මුදුන්පත් කිරීම සඳහා නායකත්වය ලබා දෙමින් සිටී.

ඔහු ලන්ඩනයේ විනිමය හා ආයෝජන ආයතනයේ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපල සුදුසුකම් ලබා ඇත.ආයෝජන විශ්ලේෂණ හා අරමුදල් පරිපාලනය පිළිබඳ ඔහු ලබා ඇති පළපුරුද්ද, කොමිෂන් සභාවේ සංවර්ධනය සඳහා ඉවහල් වේ.

# මණ්ඩලයේ සාමාජිකයින්
## 2017 දෙසැම්බර් 31 දිනට



**එල් එල් එස් වික්‍රමසිංහ**
*FCA, FMAAT*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආසන්නතම හිටපු සභාපතිවරයා වන වික්‍රමසිංහ මහතා බී ආර් ද සිල්වා සහ සමාගමේ හවුල්කරුවෙකු වශයෙන් කටයුතු කරන අතර, විගණනය, සහතික කිරීමේ සේවා, වෝහාර විගණන කටයුතු සහ බදුකරණය පිළිබඳව වර්ෂ 20 කට වඩා වැඩි පළපුරුද්දක් ලබාගෙන ඇත. ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) පාලක මණ්ඩල සාමාජිකයෙක් සහ එම සංගමයේම යහපාලන සහ විගණන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරයි. තවද ඔහු අන්තර්ජාතික ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (IFAC) සුළු හා මධ්‍යම පරිමාණ වෘත්තිකයින්ගේ කමිටුවේ සභාපති වශයෙන්ද කටයුතු කරනු ලැබේ. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE) පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කරයි.



**ඒ හේරත්**
*BSc MBA, MAFE, FCA*

මාලදිවයිනේ හා ශ්‍රී ලංකාවේ අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ ජ්‍යේෂ්ඨ හවුල්කරුවකු වන හේරත් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයකු ද වේ. ඔහු ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ (IFAC) වෘත්තිය ගණකාධිකරණ සංවිධාන සංවර්ධන කමිටුවේ සාමාජිකයකු වන අතර ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) සාමාජිකත්වය ද දරයි. ඔහු බොහෝ ව්‍යවස්ථාපිත ආයතනයන්හි අධ්‍යක්ෂවරයකු ලෙසත්, නියාමන ආයතන හා ව්‍යවස්ථාපිත කමිටුවල සාමාජිකයකු ලෙසත් සේවය කරයි.



**ඩබ්ලිව් ඩබ්ලිව් ජේ සී පෙරේරා**
*BSc(B.Admin.), FCA, CFE*

මාලදිවයිනේ හා ශ්‍රී ලංකාවේ කේපීඑම්ජී ආයතනයේ හවුල්කරුවකු වන පෙරේරා මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයාවේ. ඔහු දකුණු ආසියා ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) සුළු හා මධ්‍ය පරිමාණ වෘත්තීය කමිටුවේ හා වෘත්තීය ආචාරධර්ම සහ ස්වාධීනත්ව කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන අතර ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) රාජ්‍ය අංශ මූල්‍ය කළමනාකරණ කමිටුවේ සාමාජිකයකු ලෙසද කටයුතු කරයි. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ සහතිකලත් වංචා විමර්ශකයින්ගේ සංගමයේ සහතිකලත් වංචා විමර්ශකයකු ද වේ.



**එස් එන් ජයසිංහ**
*FCMA (UK)*

මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 27 කට අධික කාලයක පලපුරුද්දක් ලබා ඇති එස්. එන්. ජයසිංහ මහතා සිලෝන් බිස්කට් සමූහ සමාගමේ සමූහ අධ්‍යක්ෂ - මූල්‍ය ලෙස සේවය කරයි. ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) ගෝලීය මණ්ඩලයේ වසර තුනක කාලයක් සේවයකර ඇති අතර වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාවේ හිටපු සභාපතිවරයෙකු ද වේ. ඔහු ශ්‍රී ලංකා කර්මාන්ත සංගමයේ හිටපු සභාපතිවරයා වන අතර ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන කමිටුවේ ද සේවය කරයි.

# මණ්ඩලයේ සාමාජිකයින්

## 2017 දෙසැම්බර් 31 දිනට



**පී එල් සී පීරිස්**

*FCA, Attorney-at-Law*

පීරිස් මහතා පී එල් සී ලෝ චේම්බර්ස් ආයතනයේ පාලන හවුල්කරු ලෙස සේවය කරන අතර, මූල්‍ය හා ආයෝජන බැංකුකරණය පිළිබඳව වසර 22 කට අධික කාලයක පළපුරුද්දක් ලබා ඇත. නීතිය හා මූල්‍ය පිළිබඳ විද්වතෙකු වන ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අවසන් පරීක්ෂණයෙන් ද සමත් වී ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක සභාවේ සාමාජිකයකු ලෙස දැනට කටයුතු කරන ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නීතිඥ සභාවේ නියෝජිත සාමාජිකයකු ද වේ.



**එන් සිවප්‍රගාසම් මෙනෙවිය**

*FCA, FCMA (UK)*

සිවප්‍රගාසම් මෙනෙවිය එයිට්කන් ස්පෙන්ස් සමාගම් සමූහයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ලෙස කටයුතු කරන අතර එම සමාගම් සමූහයට අයත් සමාගම් කීපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ද සේවය කරයි. ඇය කොළඹ අන්තර්ජාතික නාවික හා ඉංජිනේරු විද්‍යාලයීය (පෞද්ගලික) සමාගමේ සම කළමනාකාර අධ්‍යක්ෂවරියක් වශයෙන්ද කටයුතු කරන අතර, වෙනත් බොහෝ නියාමන ආයතන හා කමිටුවල ද සේවය කරයි.



**ඒ ඩී වාස් ගුණසේකර**

*FCA, FSCMA*

ගුණසේකර මහතා සම්පත් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) ලෙස කටයුතු කරයි. ඔහු වසර 23 කට අධික කාලයක සේවා පළපුරුද්දක් ලබා ඇති අතර මෙයින් වසර 18 ක කාලයක් බැංකු හා රක්ෂණ අංශයේ ජ්‍යේෂ්ඨ සංස්ථාපිත කළමනාකරණ මට්ටමේ සේවය කර ඇත. ඔහු හැටන් නැෂනල් බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, එච් එන් බී ඇෂුවරන්ස් ආයතනයේ සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා සංස්ථාපිත සේවා), එෆියන් එලායාන්ස් මූල්‍ය සමාගමේ මූල්‍ය කළමනාකරු සහ ෆින්ලේස් සමාගමේ ගණකාධිකාරී ලෙස ද සේවය කර ඇත.

*භාණ්ඩාගාර නියෝජිත - මණ්ඩලයේ නිරීක්ෂක*



**එම් ආර් වී ආර් මීපුර**

*MBS, BSc HRM, ACA*

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන මීපුර මහතා රාජ්‍ය අංශයේ වසර 19 කට අධික කාලයක සේවා පළපුරුද්දක් ලබා ඇත. ඔහු හලාවත වැවිලි සමාගමේ හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස ද ක්‍රියා කරයි.

# මණ්ඩලයේ ආරාධිතයින්

*2017 දෙසැම්බර් 31 දිනට*

*සභාපති - ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිති කමිටුව*



**සුරේන් රාජකාරියර්**
*FCA, FCMA, FCCA*

වර්ෂ 30 කට අධික කාලයක පොදු ගිණුම්කරණ පරිචයන් පිළිබඳව පළපුරුද්දක් සහිත රාජකාරියර් මහතා කේපීඑම්ජී විගණන සමාගමේ හවුල්කරුවෙකු වේ. වර්තමානයේ කේපීඑම්ජී ආයතනයේ විගණන ප්‍රධානී ලෙස කටයුතු කරන අතර කේපීඑම්ජී ආයතනයේ සියළුම විගණනයන්හී තත්ත්ව පාලනය සහ තොරතුරු අවදානම් කළමනාකරණය පිළිබඳව වගකීමද දරනු ලැබේ.

කමිටු රාශියක සහ පීඨ රාශියක උද්යෝගීමත් ලෙස කටයුතු කරමින් රාජකාරියර් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරනු ලබන ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ කාර්යය සඳහා විශාල සහභාගිත්වයක් ලබාදී ඇත.

*සභාපති - ව්‍යවස්ථාපිත ගිණුම් ප්‍රමිති කමිටුව*



**මනිල් ජයසිංහ**
*FCA, FCMA, CIPFA*

ජයසිංහ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ උප සභාපතිවරයා වන අතරම, ඔහු අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවකු වේ. තවද, අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ බැංකුකරණ සහ මූල්‍ය සේවා පරිචයෙහි වගකීම දරන ඔහු සහතික කිරීමේ සේවා සහ වෘත්තීය පරිචය අධ්‍යක්ෂ ලෙසද කටයුතු කරනු ලැබේ.

ජයසිංහ මහතා අවුරුදු 35 කට අධික කාලයක් තුළ විගණනය පිළිබඳව විස්තීර්ණ පළපුරුද්දක් ලබාගෙන ඇති අතර, අන්තර්ජාතික ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (IFAC) අන්තර්ජාතික අධ්‍යාපන ප්‍රමිත මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කරයි.

*අධ්‍යක්ෂ ජනරාල්*



**ඩබ්ලිව් ජේ කේ ගීගනගේ මෙනෙවිය**
*BCom(Sp), FCA, CIPPCA*

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයෙහි (SLAASMB) අධ්‍යක්ෂ ජනරාල් වන ගීගනගේ මෙනෙවිය, ප්‍රමුඛතම රාජ්‍ය ආයතනවල, මූල්‍ය හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව සහ වරලත් ගණකාධිකාරී ආයතන තුළින් ලබාගත් විගණන පළපුරුද්ද සහිතව වසර 36 කට අධික කාලයක පලපුරුද්දක් ලබාගෙන ඇත. තවද, ඇය ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීන්ගේ සංගමයේ පාලක සභාවේ සහ ප්‍රධාන පෙලේ රාජ්‍ය ව්‍යාපාර ආයතනයක පරිපාලිත සමාගම් හා ආයෝජිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කර ඇත. ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ යාවජීව සාමාජිකාවක් ද වේ.

# කාර්ය මණ්ඩලය






1 ආශා අහමත් මිය
2 අනූෂා අයි මොහොට්ටි මිය
3 වසන්තා ජේ කේ ගීගනගේ මෙනවිය
4 ගයනි එල් පෙරේරා මිය
5 පී එස් බී ඒකනායක
6 එම් සුරනි ටී ප්‍රනාන්දු මෙනෙවිය
7 ඉමල්කා ඉද්දමල්ගොඩ මිය

8 ඉෂාරි එම් සිල්වා මෙනෙවිය
9 මොනිටා එන් බණ්ඩාර මිය
10 එම් ලක්මාලි හේවගේ මෙනෙවිය
11 හෆ්සා බී රසාක් මෙනෙවිය
12 දිලිනිකා මින්මෙන්දආරච්චි මිය
13 රන්දිමා ද සිල්වා මිය
14 එල් වත්සලා මල්ලවාරච්චි මිය

15 කේ රසික එස් බණ්ඩාර
16 එෆ් ශිරෝමි අබේකෝන් මිය
17 ආර් ඒ නදීශානි මනෝදිකා මිය
18 එච් එස් යු පී ජයවර්ධන
19 ඩී එම් නිලන්ති දන්දෙනි මිය
20 ඩබ්ලිව් ජී එරංගා අමාරසී මෙනෙවිය
21 කලණි හෙට්ටිආරච්චි මිය

# තාක්ෂණික කාර්ය මණ්ඩලය

**වසන්තා ගීගනගේ මෙනෙවිය**
*FCA, BCom (Sp), CIPPCA*
අධ්‍යක්ෂ ජනරාල්

**අනුෂා අයි මොහොට්ටි මිය**
*FCA, FCMA (UK), FCMA, CGMA, CPA (Aus), BBA (Hons,) MBA (Leicester)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

**ගයනි එල් පෙරේරා මිය**
*FCA, MBA (Finance)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
මණ්ඩලයේ ලේකම්

**ආශා අහමත් මිය**
*FCA*
අධ්‍යක්ෂ තාක්ෂණික

**මොනිටා එන් බණ්ඩාර මිය**
*FCA, (SL), ACA (E&W), BB Mgt (Acc) Sp*
අධ්‍යක්ෂ තාක්ෂණික

**හෆ්සා බී රසාක් මෙනෙවිය**
*FCA, ACMA (UK), CGMA, MBA(Sri. J)*
අධ්‍යක්ෂ තාක්ෂණික

**ඩබ්ලිව් ජී එරංගා අමාරසී මෙනෙවිය**
*FCA, BSc (Acc) Sp (Hons.), MBS (Col)*
අධ්‍යක්ෂ තාක්ෂණික

**එම් ලක්මාලි හේවගේ මෙනෙවිය**
*FACA, ACMA (UK), CGMA, MBA(Sri.J)*
අධ්‍යක්ෂ තාක්ෂණික

**ඉමල්කා ඉද්දමල්ගොඩ මිය**
*ACA, BSc(Fin)Sp*
අධ්‍යක්ෂ තාක්ෂණික

**දිලිනිකා මෙන්මෙන්දආරච්චි මිය**
*FCA, BSc(Acc)Sp(Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**කලණි හෙට්ටිආරච්චි මිය**
*FCA, BSc(Acc)Sp(Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**රන්දිමා ද සිල්වා මිය**
*FCA, BSc(Acc)Sp(Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**ඉෂාරි එම් සිල්වා මෙනෙවිය**
*FCA, BBA(Acc)Sp(Hons.), MBA(Sri. J)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**ඩී එම් නිලන්ති දන්දෙනි මිය**
*FCA, BBA(Acc)Sp(Hons.), AIB (SL)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

**එල් වත්සලා මල්ලවාරච්චි මිය**
*FCA, BSc(Acc)Sp(Hons.)*
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

# ක්‍රියාකාරකම් සමාලෝචනය

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ 1997 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. පනතේ සඳහන් නිර්වචන සහ නිර්ණායක මත පදනම්ව, ඇතැම් ආයතන නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් (නිර්වචනය සඳහා 54 පිටුව බලන්න.) වශයෙන් හඳුනාගෙන ඇත. මෙම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම්කරණ කටයුතු හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කළ යුතු වන අතර නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්වල විගණකවරුන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණන කටයුතු කළ යුතුවේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව කටයුතු කර ඇත්ද යන වග අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් විසින් තම විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බව පනතින් නියම කර ඇත. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්වල විගණන කටයුතු පරීක්ෂා කිරීම, ප්‍රමිතවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සහ ඒවායේ විගණකවරුන් විසින් ප්‍රමිතවලට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් උචිත නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම හරහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය සිය කාර්යයභාරය ඉටු කරනු ලැබේ. පනතට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත පැනවීම හෝ සම්මත කිරීම සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සහ එවැනි ප්‍රමිත සම්මත කිරීමේ කාර්යයේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට සහය වීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ගිණුම්කරණ ප්‍රමිත කමිටුවක් සහ විගණන ප්‍රමිති කමිටුවක් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත පාදකව ගිණුම්කරණ ප්‍රමිත සම්මත කරනු ලැබේ. ඒ හා සමානව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවනු ලබන විගණන ප්‍රමිත, අන්තර්ජාතික විගණන සහ තහවුරු ප්‍රමිත මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද අන්තර්ජාතික විගණන ප්‍රමිත මත පාදකව නිර්මාණය කෙරේ. වර්තමානයේදී නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සහ විගණකවරුන් විසින් අනුකූල වියයුතු විගණන ප්‍රමිත 38 ක් සහ ගිණුම්කරණ ප්‍රමිත 42 ක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදී ඇත. සිය ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටුකිරීම සඳහා, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රධාන මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහතින් දැක්වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

### 2.1 සමාලෝචනය සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කර ඇත්ද යන්න තහවුරු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට භාජනය කරනු ලැබේ. ගිණුම් ප්‍රමිතවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් ගත යුතු පියවර තීරණය කිරීම, අනුකූල නොවීමේ ප්‍රමාණාත්මකභාවය මත සිදු කරනු ලැබේ. හඳුනාගැනීම් සහ මිනුම්කරණය මෙන්ම අනාවරණයන් හා ඉදිරිපත් කිරීම පිළිබඳව අනුකූල නොවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය ප්‍රධාන වශයෙන් සිය අවධානය යොමු කරනු ලැබේ. ප්‍රමිතවලට අදාළව අනුකූල නොවීම් සම්බන්ධයෙන් වන ප්‍රමාණාත්මක කරුණක් නිරීක්ෂණය නොවන අවස්ථාවකදී එබඳු මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල මූල්‍ය වාර්තා ලෙස සැළකේ. හඳුනාගනුලැබූ අනුකූල නොවීම්, ප්‍රමාණාත්මක වුවත් ව්‍යවස්ථාපිත විධිවිධාන භාවිතා කිරීමට තරම් වැදගත් නොවන අවස්ථාවන්හිදී එවැනි මූල්‍ය ප්‍රකාශන නිරීක්ෂණ සහිතව අනුකූල වූ ඒවා ලෙස සලකනු ලබන අතර, ඒ පිළිබඳ නිරීක්ෂණ, අදාළ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය වෙත උපකාරක ලිපියක ස්වභාවයෙන් දැනුම් දෙනු ලැබේ. ප්‍රමිතිවලින් බැහැර වීම, ප්‍රමාණාත්මක ලෙස මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය වෙනස්වීමට හේතුවී ඇත්නම්, එවැනි නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් විසින් ප්‍රකාශනය සඳහා සකස් කරන ඊළඟ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරනු ලබන බවට එකඟත්වයක් ලබාගනු ලැබේ. කෙසේවෙතත්, එවැනි බැහැරවීමක් මගින් මූල්‍ය ප්‍රකාශන තුළ සාවද්‍ය නිරූපණයක් සිදුවේ නම් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනයේ වැදගත් අවස්ථා

2017 දෙසැම්බර් 31 දින වන විට, පනත යටතේ අධීක්ෂණය කළ යුතු නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 1,559 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ දී නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 1,479 ක මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,643 ක් ඉදිරිපත් කර තිබූ අතර, ඒවායින් සමහරක් මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂ හා අදාළ වේ.

2016 වර්ෂයේදී විදේශීය උපදේශකයෙකු විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත මණ්ඩලයේ නිළධාරීන් වෙත ලබාදුන් විස්තීර්ණ පුහුණුවේ ප්‍රතිඵලයක් ලෙස, අනිකුත් විගණන නියාමකයින් භාවිතා කරනු ලබන ගෝලීය පරිචයන්ට අනුකූළ වන පරිදි, විගණන පරීක්ෂණ සඳහා එතෙක් අනුගමනය කරන ලද ප්‍රවේශයෙහි වෙනස් කිරීමක් සිදු කරන ලදී. මෙම නව ප්‍රවේශය ඉතා ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍රයන් හඳුනාගැනීමෙන්, ආරම්භ කෙරෙන අතර, එවැනි ඉතා ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍රයන් ගැඹුරු පරීක්ෂාවකට භාජනය කෙරේ. මෙම නව ප්‍රවේශයේ ප්‍රතිඵලයක් ලෙස, විගණනයන් සිදු කිරීමේදී විගණන ප්‍රමිත වලින් බැහැරවීම් සිදුවී ඇතිබව හඳුනා ගැනීම පහසු විය. කෙසේ වෙතත්, එවැනි පරීක්ෂණ සමාප්තිය සඳහා ආසන්න වශයෙන් දින 4-5 ක කාලයක් ගතවනු ඇත.

# ක්‍රියාකාරකම් සමාලෝචනය

විගණන පරීක්ෂණ වලින් සොයා ගනු ලබන කරුණුවල ස්වභාවය ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත වීම තුළින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ක්‍රියාවලිය සඳහා වැය කිරීමට සිදුවන කාලයේ අඩුවීම පිළිබඳව සාක්ෂියක් සපයයි. මෙම හේතුව පාදකව ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී සියළුම නියාමනයට යටත්වන ආයතනවල හා අනිකුත් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් සමූහයක මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට භාජනය කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය වර්ෂ 3-5 ක කාල පරාසයක් තුළදී, සියළුම අනිකුත් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් හී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට භාජනය කිරීමට සැළසුම් කර ඇත. ඉතා ඉහළ අවදානම් සහිත, ආර්ථිකමය වශයෙන් ප්‍රමාණාත්මක නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් හි අනුකූළතා මට්ටම ඉහළ නැංවීමේ අරමුණ සහිතව, ඉතා ඉහළ අවදානම් සහිත නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් වල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් වැඩි අවධානයකින් යුතුව සමාලෝචනයට භාජනය කෙරේ.

පරීක්ෂණ ප්‍රවේශය වෙනස්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, සැළසුම් කර තිබූ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රකාශන 511 හා සංසන්දනාත්මකව සමාලෝචිත වර්ෂය තුළදී නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 459 ක් හා සම්බන්ධිත මූල්‍ය ප්‍රකාශන කට්ටල 518 ක් සමාලෝචනය කිරීමට සමත් විය. නව ප්‍රවේශය පෙර වර්ෂයේ අවසාන කාර්තුවේදී ආරම්භ කළ අතර, එම වර්ෂය තුළදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 678 ක් හා සම්බන්ධිත මූල්‍ය ප්‍රකාශන කට්ටල 731 ක් සමාලෝචනයට භාජනය කරන ලදී.

## 2.3 මණ්ඩලයේ කාර්යසාධන දත්තයන්

| | අයිතමය | පෙර පැවති සමාලෝචන ක්‍රමවේදය යටතේ කාර්යසාධනය | | නව සමාලෝචන ක්‍රමවේදය යටතේ කාර්යසාධනය | |
|---|---|---|---|---|---|
| | **වර්ෂය** | **2014** | **2015** | **2016** | **2017** |
| 1 | **හඳුනාගන්නා ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සංඛ්‍යාව (කාලච්ඡේදයේ අවසාන දිනට)** | 1,353 | 1,140 | 1,485 | **1,559** |
| 2 | **ලද මූල්‍ය ප්‍රකාශන** | | | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව (වර්ෂ කිහිපයක් සඳහා ලද මූල්‍ය ප්‍රකාශන සහිතව) | 1,371 | 1,430 | 1,536 | **1,643** |
| | නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 1,289 | 1,345 | 1,412 | **1,479** |
| 3 | **මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය** | | | | |
| | සමාලෝචන සංඛ්‍යාව | 1,200 | 1,122 | 731 | **518** |
| | නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 1,151 | 1,068 | 678 | **459** |
| 4 | **නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග** | | | | |
| | **අනුකූලවීම්**<br>මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව<br>නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 498<br>483 | 553<br>534 | 436<br>417 | **324**<br>**306** |
| | **නිරීක්ෂණ සහිතව අනුකූල වීම්**<br>මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව<br>නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 697<br>674 | 567<br>541 | 291<br>262 | **185**<br>**150** |
| | **අනුකූල නොවීම්**<br>මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව<br>නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 5<br>5 | 2<br>2 | 4<br>4 | **9**<br>**9** |
| 5 | **නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නි.ව්‍යා.ව්‍යවසායන්හි සමාලෝචනවල % ලෙස** | | | | |
| | අනුකූල වීම්<br>නිරීක්ෂණ සහිත අනුකූල වීම්<br>අනුකූල නොවීම් (ඒකඟතාවයන් ලබාගැනීම හා විධානයන් පැනවීම්) | 42%<br>58%<br>- | 50%<br>50%<br>- | 61%<br>38%<br>1% | **66%**<br>**32%**<br>**2%** |

# ක්‍රියාකාරකම් සමාලෝචනය

2.4 2017 වර්ෂය තුළදී ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අනුව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 66% ක් අනුකූලවද, තවත් 32% ක ප්‍රමාණයක් නිරීක්ෂණ සහිතව අනුකූලවද 2% ක් අනුකූල නොවන ඒවා බවද අනාවරණය විය.

2.5 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල නිර්දේශයන් සැළකිය යුතු ලෙස අනුගමනය කර නොතිබීම හේතුවෙන් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් අටක (08) මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය සැළකිය යුතු ලෙස වෙනස් වී ඇති බව අනාවරණය වු අතර, එම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 08 න් 04 ක් ලැයිස්තුගත සමාගම් හා 03 ක් රජයේ සංස්ථාවන් විය. ලබා ගන්නා ලද එකඟතාවයන්ගේ ප්‍රතිඵලයක් ලෙස අදාළ ව්‍යාපාරවල ශුද්ධ ලාභය/හිමිකම රුපියල් බිලියන 2.2 කින් නිවැරදි කිරීමක් සිදුවිය. (මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සම්බන්ධ නිරීක්ෂණ සඳහා 15 වන පිටුව සහ 2017 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන් සඳහා 17 වන පිටුව බලන්න.) මෙම එකඟතාවයන් හා අනුකූලව කටයුතු කරන්නේද යන්න පරීක්ෂා කිරීම ඉදිරිකාලීන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල පසු විපරම් කිරීමෙන් සිදු කරනු ලැබේ. එක් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායක විගණකයා විසින් විගණන ප්‍රමිතීන්හි අවශ්‍යතාවයන්ට අනුකූළව කටයුතු නොකිරීම හේතුවෙන් එම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායේ මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කොට නැවත ප්‍රසිද්ධ කරන ලෙස විධානයක් වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

2.6 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් ප්‍රමාණවත් වන නමුත් ඒවා ව්‍යවස්ථාපිත විධිවිධාන භාවිතා කිරීමට තරම් වැදගත් නොවන අවස්ථාවන් ලෙස හඳුනාගත් විට, එවැනි අනුකූල නොවීම් උපකාරක ලිපි ස්වරූපයෙන් සන්නිවේදනය කරනු ලැබේ. නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්වලට තම මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය වැඩි දියුණු කරලීම දිරිගන්වනු පිණිස උපකාර ලිපි 185 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

2.7 2013 දෙසැම්බර් 31 දායින් අවසන් වර්ෂයට අදාළවූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද රාජ්‍ය සංස්ථාවක් වෙත හැකි ඉක්මනින් සහ සාධාරණ නොවන ප්‍රමාදයක් රහිතව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බව දන්වමින් අවවාදාත්මක ලිපියක් නිකුත් කරන ලදී.

## 3. විගණන පරීක්ෂණ

3.1 සමාලෝචිත වර්ෂය තුළදී වෘත්තියේ නියුක්ත වරලත් ගණකාධිකාරී ආයතන 13 ක් විසින් සිදුකරන ලද විගණන 100 ක් පරීක්ෂා කරන ලද අතර, සංසන්දනාත්මකව පූර්ව වර්ෂයේදී ආයතන 14 ක් විසින් සිදුකරන ලද විගණන 99 ක් පරීක්ෂා කර ඇත.

3.2 සමාලෝචිත වර්ෂය තුළදී පරීක්ෂා කරන ලද විගණන ලිපි ගොනු අවදානම් පාදක ප්‍රවේශය මත තෝරාගන්නා ලදී. අවදානම් පාදක විගණන බොහොමයක්, ආයතන සුළු ප්‍රමාණයක් අතර කේන්ද්‍රගත වීම හේතුවෙන් 2017 වර්ෂය තුළදී පරීක්ෂාවට භාජනය කරන ලද විගණන ආයතන සංඛ්‍යාව 2016 වර්ෂයට සාපේක්ෂව අඩුවිය.

3.3 2016 ජාතික අයවැය ලේඛනය මගින් වෙන් කරන ලද ධාරිතා සංවර්ධනය කිරීම සඳහා වු අයවැය ප්‍රතිපාදනය භාවිතයට ගෙන, ජාත්‍යන්තර උපදේශකයකු විසින් පවත්වන ලද විස්තීර්ණ පුහුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් විගණන පරීක්ෂණ ප්‍රවේශය පිළිබඳව සැළකිය යුතු වෙනස්කම් සිදුකිරීමට හැකියාව ලැබිණි. ගෝලීය පරිචයන් හා සමරූපී වන මෙම ප්‍රවේශයේදී, විශේෂිතව අරමුණුගත වන්නේ ආශ්‍රිත අවදානම් හඳුනාගැනීම එවැනි විගණනවල තෝරාගත් අංශයන් පිළිබඳව එමගින් ගැඹුරු පරීක්ෂාවක් සිදුකිරීමයි. පෙරදී අනුගමනය කරන ලද විගණන ක්‍රමවේදය හා සාපේක්ෂව, මෙම නව ප්‍රවේශය භාවිතයෙන් පරීක්ෂාවක් සම්පූර්ණ කිරීමට සෑහෙන කාලයක් වැය කල යුතුවේ.

3.4 නව ප්‍රවේශය වර්ෂය පුරාම භාවිතයට ගනු ලැබූ සමාලෝචිත වර්ෂය තුළදී, විගණන පරීක්ෂණ මගින් සැළකිය යුතු අනුකූළ නොවීම් නිරීක්ෂණය කල අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයට, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 2 ක් වෙත විධානයන් නිකුත් කිරීම මගින් ඒවායේ මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කිරීමට සහ විගණකයෙක් වෙත අවවාදාත්මක ලිපියක් නිකුත් කිරීමට සිදු විය. වර්ෂය තුළදී කරන ලද පරීක්ෂාවන්හි ප්‍රතිඵලයක් ලෙස විගණන ආයතන 13 ක් විසින් කරන ලද විගණන 43 ක අඩුපාඩුකම් අනාවරණය කරගැනීමට හැකිවූ අතර, එම ප්‍රමාණය 2016 වර්ෂයේදී පිළිවෙලින් විගණන ආයතන 12 ක් සහ විගණන 55 ක් විය. අදාළ විගණන ආයතන වෙත ප්‍රමාණාත්මක ලෙස අවධාරණයට භාජනය වු කරුණු සන්නිවේදනය කරන ලදී. (විගණන නිරීක්ෂණ සම්බන්ධ තොරතුරු සඳහා 19 වන පිටුව බලන්න)

3.5 අවදානම් පාදක ප්‍රවේශය සහිත විගණන පරීක්ෂණ හැරෙන්නට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී තේමාවන් දෙකක් මත තේමාමය පරීක්ෂාවන් සිදුකරන ලදී. ඒවා නම්, තත්ත්ව පාලන සමාලෝචක නියුක්තිකරණයේ කාර්යභාරය හා ආයතනික පාලනයට වගකිව යුත්තන් හා සන්නිවේදනයයි. විගණන ආයතන 06 ක් පාදකව තේමාමය පරීක්ෂණ 15 ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදී. 2018 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට යෝජිත විගණන ආයතන සම්බන්ධයෙන් වන තත්ත්ව පරීක්ෂණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට අවශ්‍ය

# ක්‍රියාකාරකම් සමාලෝචනය

කටයුතු සංවිධානය කිරීම සඳහා වර්ෂය තුළදී විස්තරාත්මක සැළසුම්, ප්‍රශ්නාවලි සහ ආකෘති නිර්මාණය කරන ලදී. එවැනි පරීක්ෂාවක් සඳහා යටත්වීමට ස්වෙච්ඡාවෙන්ම කැමති වන විගණන ආයතනවල, ආයතනය පුරා විහිදුනු තත්ත්ව පාලන පරීක්ෂාවන් පවත්වාගෙන යාමට සැළසුම් සකස් කොට ඇති අතර, අනාගතයේදී, එවැනි ආයතන පුරා විහිදුනු තත්ත්ව පාලන පරීක්ෂාවන් අනිවාර්යය කෙරෙන පරිදි අදාළ නීතිරීති සංශෝධනය සඳහා දැනට කටයුතු කරමින් පවතී.

## 4. විමර්ශන

### 4.1 ඇඩම් කැපිටල් පොදු සමාගම

2014 මාර්තු 31 සහ 2015 මාර්තු 31 දායින් අවසන් වර්ෂ සඳහා ඇඩම් කැපිටල් පොදු සමාගමේ එවකට සිටි විගණක විසින් සමාගම ගිණුම් පොත්පත් සහ අදාළ ලේඛන නිසි පරිදි පවත්වාගෙන යාමට අපොහොසත් වීම යන පදනම මත විගණන මතය වියාචනය කර ඇත. එසේනමුදු, 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට භාජනය කර, එම වර්ෂයේ විගණකයා විසින් තත්ත්වාගණනය නොකල විගණන මතයක් ඉදිරිපත් කර තිබූ හෙයින්, මේ සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් කල පරීක්ෂණයේදී අදාළ විගණකයා විගණන ප්‍රමිත හා අනුකූල නොවන ආකාරයට කටයුතු කර ඇති බවට නිරීක්ෂණය කරන ලදී. විගණකයා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ නිගමනය සමඟ එකඟ නොවූ නමුත්, විගණන කාර්ය පත්‍රිකාවලින් එම නොඑකඟතාවය තහවුරු කිරීමට ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඒ අනුව, මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරන ලෙස විධානයක් නිකුත් කරන ලදී. නැවත විගණනය සඳහා වන පිරිවැය සමාගම විසින් දැරීමට අකමැති වූ හෙයින් විගණකයා හා සම්බන්ධව ගතයුතු පියවර පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය, නීතිපතිවරයාගෙන් විමසීමක් කර ඇත.

### 4.2 අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම

අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම විසින්, විගණකයාගේ ද සහාය සහිතව ගිණුම් පොත්පත් නිසි පරිදි පවත්වාගෙන නොයෙන බවට ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයට පැමිණිල්ලක් ලැබී තිබුණි. එහි ප්‍රතිඵලයක් සේ මේ සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් 31 දායින් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව කරන ලද පරීක්ෂාවේදී, විගණකයා විසින් තත්ත්වාගණනය නොකල මතයක් ඉදිරිපත් කර තිබුණද, විගණන ප්‍රමිත හා අනුකූලව විගණන කටයුතු කර නොමැති බව අනාවරණය කරගන්නා ලදී. මූල්‍ය ප්‍රකාශනවල වූ අවනිදේශනයන්ගේ ප්‍රමාණාත්මකභාවය සැළකිල්ලටගත් මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් 31 දායින් අවසන් වර්ෂය සඳහා අදාළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කොට නැවත ප්‍රකාශයට පත් කරන ලෙස විධානයක් ලබාදෙන ලදී. නැවත විගණනය එම විගණන ආයතනයේම වෙනත් විගණන හවුල්කරුවෙක් විසින් ක්‍රියාත්මක කළ අතර, පෙරදී නිකුත් කර තිබූ තත්ත්වාගණනය නොකල මතය වෙනුවට, නැවත විගණනයේදී මතය වියාචනය කිරීමක් සිදුකර ඇත. සමාගමේ කළමණාකරනයට එරෙහිව මේ සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව නීතිමය උපදෙස් ලබාගැනීමට මෙම කරුණු නීතිපතිවරයා වෙත යොමු කර ඇති අතර, විගණකයාගේ විෂමාචාරය පිළිබඳව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයටද දැනුම් දී ඇත.

## 5. පොදු ව්‍යාපාර ව්‍යවසායන් පිළිබඳ කමිටුවේ (COPE) නිර්දේශයන්ගේ කාර්යසාධනය

පොදු ව්‍යාපාර ව්‍යවසාය කමිටුවට (කෝප් කමිටුවට) ලබාදුන් එකඟත්වයට අනුරූප වන පරිදි, 2014 සහ 2015 යන වර්ෂවල සියළුම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්හී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට භාජනය කරන ලද අතර, අනාවරණයන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වඩා හොඳ ක්‍රමවේදයක් වශයෙන් ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් ඉන් පසුව මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සඳහා අවදානම් පාදක පරීක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය සියලුම නියාමනයට යටත්වන ආයතනවල සමාලෝචනයන් වාර්ෂිකව සිදුකරමින් අනිකුත් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්හී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සිදුකිරීමේදී ඉහළ අවදානම් සහිත පෞද්ගලික ආයතන සඳහා සෑම වර්ෂ 3 ක් තුලදී සහ අඩු අවදානම් සහිත පෞද්ගලික ව්‍යාපාර වර්ෂ 5 ක් තුළදී වන පරිදි වර්ෂ 3-5 දක්වා වූ කාලපරාසයක් තුළදී සමාලෝචන සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. ලෝක බැංකුව විසින් Report on the observance of Standards and Codes, Accounting and Auditing 2015 (ROSC) යන නමින් නිකුත් කළ වාර්තාව මගින් සහ ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් විසින් ඉහළ අවදානම් සහිත ආයතන සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීම පිළිබඳව උපදෙස් ලබාදී ඇත. තවද 2016 වර්ෂයේ සේවක මණ්ඩලයේ ධාරිතා වර්ධන කටයුතුවල නියැලී සිටි අන්තර්ජාතික උපදේශකවරුන් විසින්ද මෙම ක්‍රමවේදය ගෝලීය වශයෙන් භාවිතා කරන ක්‍රමවේදයක් වශයෙන් හඳුන්වා දී ඇත.

# ක්‍රියාකාරකම් සමාලෝචනය

2017 වර්ෂයේදී සිදුකරන ලද පරීක්ෂණ වලින් ඉස්මතු වූ අනාවරණයන් තුළින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේදී අවදානම් පාදක පරීක්ෂාව තෝරාගැනීම මඟින් මූල්‍ය ප්‍රකාශන හා විගණන ක්‍රියාවලිය තුළ ශක්තිමත්භාවයක් අන්තර්ගතව ඇති බව නිරූපණය විය. නිශ්චිත අංශයන් නිසි පරිදි අරමුණුගතව සිදුකෙරෙන එවැනි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය, එම මූල්‍ය ප්‍රකාශන විගණන පරීක්ෂණ කිරීමේදී උපකාර වන අතර එමගින් විගණනයන්හි අනුකූල නොවීම් වඩාත් පහසුවෙන් හඳුනාගැනීමට හැකියාවක් ලැබේ.

## 6. ප්‍රමිත ස්ථාපිත කරන්නාට සහයෝගය

වර්තමානයේදී මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ ඇතිකරගෙන ඇති ගිවිසුම් ප්‍රකාරව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට, ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සහ විගණන ප්‍රමිත කමිටුවේ කාර්යභාරය සපුරාලීමට මෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත භාවිතය සඳහා ඒවා නිකුත් කිරීමට පෙර කළ යුතු සිංහල සහ දෙමළ මාධ්‍යයන්ට පරිවර්ථනය කිරීම සඳහා දැරීමට සිදුවන වැය වෙනුවෙන් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින්, වාර්ෂිකව රු.මිලියන 2.5 ක ප්‍රදානයක් ලබාදෙනු ලැබේ. ගිණුම්කරණ හා විගණන ප්‍රමිත කමිටුව මසකට වරක් ඔවුනගේ රැස්වීම් පවත්වනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුව සහ විගණන ප්‍රමිත කමිටුව ඔවුනගේ තාක්‍ෂණික ප්‍රකාශනයට පත්කිරීම් සහ ගිණුම්කරණ හා විගණන ප්‍රමිත හා බැඳුනු සංවර්ධන කටයුතු සඳහා ප්‍රවේශය ලබාදෙන ආකාරයට ඒ සඳහා කැපවුන වෙබ් අඩවියක් නිර්මාණය කර ඇත. (ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සංශෝධනය හා බැඳුනු කටයුතු පිළිබඳව වර්ෂය තුළදී සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව පිටු අංක 35 බලන්න.)

## 7. ජාත්‍යන්තර සබඳතා

7.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ජාත්‍යන්තර සංවිධානයන්හි සාමාජිකත්වය ලබාගැනීම හේතුවෙන් මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ ප්‍රමිතිවලට අනුකූලවීම් සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සම්බන්ධිත කරුණු පිළිබඳ ලෝකය පුරා සිදුවන නව වර්ධනයන් සමඟ සමාන වන පරිදි කටයුතු කිරීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම අනෙකුත් නියාමකයන්ගේ තොරතුරු සහ සහාය ලබාගැනීමට සහ ඒකාබද්ධ ක්‍රියාකාරකම් වශයෙන් බොහෝ නියාමකයින් සඳහා ප්‍රයෝජනවත් වන ක්‍රියාකාරකම්වල නිරතවීම සඳහාද එමගින් අවකාශ සැලසී ඇත. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය මෙම වර්ෂය තුළ පහත සඳහන් ජාත්‍යන්තර සංවිධානවල සිය සාමාජිකත්වය තවදුරටත් පවත්වා ගෙන යන ලදී.

(අ) ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) - 2007 වර්ෂයේදී පැවැත්වූ පළමු රැස්වීමේ සිට ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි සාමාජිකත්වය දරනු ලැබේ.

(ආ) ජාත්‍යන්තර විගණන හා තහවුරු ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශාත්මක නිර්දේශ කණ්ඩායම - 2007 වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි සාමාජිකයෙකු වශයෙන් පත්කරන ලදී.

(ඇ) ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාරධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශාත්මක නිර්දේශ කණ්ඩායම - 2009 වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි සාමාජිකයෙකු වශයෙන් පත් කර ඇත.

7.2 ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩලය ජාත්‍යන්තර ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිති (ISAR) පිළිබඳ අන්තර්ජාතික ප්‍රවීණයන්ගේ කණ්ඩායම් සැසියේදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

7.3 ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය, ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ (IFIAR) වැඩමුළුවක් 2018 වර්ෂයේදී කොළඹදී පැවැත්වීමට කරන ලද ආරාධනාව යථාර්ථයක් බවට පත්විය. ඒ අනුව, IFIAR 2018 පෙබරවාරි 19-22 දින වලදී ශ්‍රී ලංකාවේ වැඩමුළුවක් සංවිධානය කිරීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්‍ෂණ මණ්ඩලය සමඟ කටයුතු සම්පාදනය කරනු ලැබේ. කොළඹදී පැවැත්වෙන මෙම වැඩමුළුව සඳහා විවිධ භූගෝලීය කලාප තුල රටවල් 40 ක් නියෝජනය කරමින් 110 කට වැඩි පිරිසක් ලියාපදිංචි වී ඇත. ගෝලීය විගණන නියාමකයින්ට ඔවුන්ගේ දැනුම සහ පළපුරුද්ද ඔවුන් අතර හුවමාරු කර ගැනීමටත් විගණනයන්හී අනාගත සංවර්ධනය සඳහා විය යුතු ගමන් මාර්ගය සහ නව සංවර්ධනයන් පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීමටත් එමගින් අවස්ථාවක් ලැබේ.

7.4 ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති හා විගණන ප්‍රමිති මූලධර්ම පිළිබඳ දැනුම, නවීනතම ප්‍රමිති පිළිබඳ දැනුවත් වීම, ප්‍රමිතිවල නවීන සහ අනාගත සංවර්ධනයන්ගේ දිශානතිය පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගැනීම සඳහා පහසුකම් සැපයෙන ජාත්‍යන්තර සැසිවලට ද කාර්යමණ්ඩලය සහභාගී වූහ. මෙම සැසි, ජාත්‍යන්තර සබඳතා ස්ථාපිත කිරීම සාක්ෂාත් කරගැනීමටත් සිද්ධි අධ්‍යයනයන් සහ නිර්වචනයන් මගින් දැනුම හුවමාරුකර ගැනීමේ අවස්ථා සඳහා මූලධර්ම යොදා ගැනීම පිළිබඳව ප්‍රායෝගික මඟපෙන්වීම්

# ක්‍රියාකාරකම් සමාලෝචනය

ලබා ගැනීමටත් උපකාරි විය. අනිකුත් ගෝලීය නියාමකයින් භාවිතා කරනු ලබන විගණන පරිචයන් පිළිබඳව දැනුමක් ලබාගැනීමටද ඔවුනට එමඟින් හැකියාවක් ලැබුනු අතරම, පරීක්‍ෂණ ක්‍රමවේදයන් තවදුරටත් වර්ධනය කර ගැනීමටද හැකියාවක් ලැබිණි.

## 8. මානව සම්පත්

### 8.1 කාර්ය මණ්ඩලය

2017 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩලය 22 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් 15 දෙනෙක් වරලත් ගණකාධිකාරීවරු වූහ. සමස්ත තාක්ෂණ කාර්යමණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු දෙදෙනෙක්, තාක්ෂණික කළමණාකරුවන් 6 දෙනෙක් සහ සහකාර තාක්ෂණික කළමනාකරුවන් 6 දෙනෙකුගෙන් සමන්විත විය. තාක‍්ෂණික කාර්ය මණ්ඩලයෙන් 6 දෙනෙක් කොන්ත්‍රාත් පදනම මත පත්කර ඇති අතර, 09 දෙනෙක් ස්ථිර පදනම මත සේවා නියුක්තව සිටී. සම්මන්ත්‍රණ වැඩමුළු සහ වර්ෂය තුළදී පවත්වන ලද පුහුණු වැඩ සටහන් 9 කින් සේවක මණ්ඩලයට මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ නියාමනය පිළිබඳව අවශ්‍ය ජාත්‍යන්තර දැනුම හා නිරාවරණය ලබාදී ඇත.

### 8.2 බාහිර සමාලෝචන මණ්ඩලය

පොදු ව්‍යාපාර ව්‍යවසායන් පිළිබඳ කමිටුව විසින් නිකුත් කරන ලද නිර්දේශවලට අනුකූලවනු වස් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් සමාලෝචනයට භාජනය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් දරනු ලබන ප්‍රයත්නයේදී මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම සඳහා බාහිර සමාලෝචකයින් යොදා ගැනීම අඛණ්ඩව සිදුකෙරුණි. සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ කරන ලද මූල්‍ය වාර්තා සමාලෝචන ප්‍රමාණයෙන් මූල්‍ය වාර්තා කට්ටල 125 ක මූලික සමාලෝචනය බාහිර සමාලෝචකයින් විසින් සම්පූර්ණ කරන ලදී. බාහිර සමාලෝචකයින් සඳහා වර්ෂය තුළ රුපියල් මිලියන 1.9 ක මුදලක් ගෙවනු ලැබීය. අමතර තොරතුරු ලබාගැනීම, නිවැරදි කිරීම සඳහා එකඟතාවයන්ට එළැඹීම සහ නිරීක්ෂණ ලිපි නිකුත් කිරීම මෙන්ම නීතියානුකූලව සිදුකළ යුතු නිවැරදි කිරීමේ පියවරයන් ගැනීම සහිත වූ අවසාන සමාලෝචන කටයුතු සම්පූර්ණ කිරීම ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ තාක්ෂණ කාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයන් සම්පූර්ණ කිරීමේ කාර්යයේදී මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 393 ක මූලික සමාලෝචන කටයුතු සිදුකරන ලදී.

## 9. ආයතනික පාලනය

9.1 පනතේ විධිවිධාන ප්‍රකාරව නිලබලයෙන් පත්කරන ලද සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සහ හඳුනාගන්නා ලද ආයතනවලින් ලද නාමයෝජනා අතරින් මුදල් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 10 දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනාට ඇතුළත්වේ. පත්කළ සාමාජිකයන් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (සාමාජිකයින් 3 දෙනෙක්), එක්සත් රාජධානියේ වරලත් කළමනාකාර ගණකාධිකාරීන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා අංශය, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා කර්මාන්ත සහ වානිජ මණ්ඩල සම්මේලනය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම්කරනු ලබන තැනැත්තන්ය. සාමාජිකයෙකුගේ නිලකාලය වර්ෂ හතරකි.

9.2 පෙර සිටි සභාපතිවරයා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති සහ අනුකූලතා අධ්‍යක‍්ෂ පී.වී.එල් නන්දසිරි මහතා 2017 අප්‍රේල් මස 30 වන දින ඉල්ලා අස්වු හෙයින් ඒ වෙනුවට ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ආර්.ඒ.ඒ.ජයලත් මහතා 2017 ජුනි මස 15 වන දින සිට පත්කර ඇත. ශ්‍රී ලංකා කර්මාන්ත හා වානිජ මණ්ඩල සම්මේලනයෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නාමයෝජනා නොලැබීම නිසා මණ්ඩලයේ තනතුරු 2 ක් වර්ෂය අවසානය දක්වා පුරප්පාඩුව පැවතුණි.

9.3 පනත ප්‍රකාරව මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කල ඒ.ඩී. වාස් ගුණසේකර, එන්. ජයසිංහ සහ එන්. සිවප්‍රගාසම් යන මහත්ම මහත්මීන් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් වල අධ්‍යක්ෂවරු හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීවරු වශයෙන් සේවය කළහ. එමෙන්ම මණ්ඩලයේ සාමාජිකයන් වූ ඒ. හේරත්, ජේ. පෙරේරා සහ එල්. වික්‍රමසිංහ යන මහත්වරු ඇතැම් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් විගණනය කරනු ලබන ගණකාධිකාරී ආයතනවල හවුල්කරුවන් වශයෙන් කටයුතු කළහ. තවද, ඩී.ටී.එස්.එච්.මුදලිගේ සහ එස්.රාජපක‍්ෂ, එම්.ආර්.වී.ආර්.මීපුර, එච්.එම්.ඒ.ජයසිංහ සහ ටී.ජේ.එස්.රාජකාරියර් යන මහත්වරු මණ්ඩලයේ නිරීක‍්ෂකයින්/ආරාධිතයින් ලෙස මෙන්ම ඇතැම් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්වල අධ්‍යක‍්ෂවරු වශයෙන් හෝ ඇතැම් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්වල විගණනයන් කරනු ලබන ආයතනවල හවුල්කරුවන් වශයෙන් කටයුතු කරන ලදී. ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම පිණිස නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් හෝ එහි විගණනයට අදාළ සියළු ලිපි ලේඛන/පත්‍රිකා අදාළ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් හෝ ඒවායේ විගණකවරු සමඟ සබඳතා ඇති සාමාජිකයින් වෙත ලබා නොදෙන අතර එම නිශ්චිත

# ක්‍රියාකාරකම් සමාලෝචනය

ව්‍යාපාර ව්‍යවසායන්ට අදාළ කරුණු ඇතුළත් සාකච්ඡා සඳහා එවැනි සාමාජිකයෝ සහභාගී කරවා නොගැනීමට අවශ්‍ය කටයුතු මණ්ඩලය විසින් කරනු ලැබේ.

9.4 වර්ෂය තුළ මණ්ඩලයේ රැස්වීම් වාර 12 ක් පවත්වන ලදී. සමස්ථ මෙහෙයුම් දර්ශකයන්ට අනුව කාර්ය මණ්ඩල සාධනය සහ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්හී විගණකයින් හා සම්බන්ධ වැදගත් තාක්‍ෂණික ගැටළු විසදීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග පිළිබඳව කරුණු සාකච්ඡා කරන ලදී. තවදුරටත්, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් සිදුකරන ලද ප්‍රමිත වලට අනුකූල නොවීමේ අවස්ථාවන් පිළිබඳව අවධාරණය යොමු කරන ලද අතර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය ලේඛනය සහ ක්‍රියාකාරී සැළසුම අනුමත කිරීමද සිදුකරන ලදී. තාක්ෂණික ක්‍රියාකාරකම් සඳහා යෝග්‍ය කාර්යමණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීම උදෙසා කාර්යමණ්ඩල පාර්ශ්‍රමික පිළිවෙත සංශෝධනය කිරීම සඳහා උපයෝගී කරගත හැකි විවිධ ප්‍රවේශයන් සමාලෝචනය කිරීමේ කාර්යයයෙහි ද මණ්ඩලය නිරත විය.

9.5 මණ්ඩලයේ අධිකාරී බලය පැවරීමේ ප්‍රතිපත්තිය අනුව, ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම අධීක්‍ෂනය සඳහා අවශ්‍ය තොරතුරු රැස්කිරීම, මූල්‍ය ප්‍රකාශන සහ විගණන සමාලෝචනය කිරීම සහ විමර්ෂණ පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් මෙහෙයුම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනෙකු සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිරන්තර අධීක්ෂණය සහ මගපෙන්වීම යටතේ කාර්යමණ්ඩලය විසින් ඉටුකරන ලදී.

## 10 මූල්‍ය කාර්යසාධනය

වර්ෂය තුළ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මෙහෙයුම් වියදම රුපියල් 84,352,282 ක් වූ අතර ඊට අනුරූපව පූර්ව වර්ෂයේ වියදම රුපියල් 94,050,511 ක් විය. සංසන්දනාත්මකව 2016 වර්ෂයේදී වැය කිරීමට සිදුවූ විශේෂ ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන සඳහා වැය කළ රුපියල් 21,679,040 මෙම වර්ෂයේ මෙහෙයුම් වියදම් සැලකිය යුතු ලෙස අඩුවීම සඳහා හේතු විය. වර්ෂය තුළ මෙහෙයුම් වියදමේ වැඩිවීම (ධාරිතා ප්‍රවර්ධන වියදම් හැර) 16.55% ක් විය. වර්ෂය තුළ කාර්යමණ්ඩල පිරිවැය රුපියල් 42,351,100 ක් වූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ කාර්යමණ්ඩල පිරිවැය 39,350,132 ක් වූ අතර, එමඟින් වර්ෂයේ කාර්යමණ්ඩල පිරිවැයේ 7.6% ක වර්ධනයක් නිරූපණය කරයි. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මෙහෙයුම් වියදම්වලින්, කාර්යමණ්ඩල පිරිවැය 50.2% ක් වේ.

රජය විසින් සපයන ලද අරමුදල් මගින් වියදම් පියවා ගැනිණි. මණ්ඩලයේ වියදම් පියවා ගැනීම සඳහා විකල්පයක් ලෙස පනත ප්‍රකාරව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි කොටස්හිමියන්ගේ ස්කන්ධය හෝ බදු ගෙවීමෙන් පසු ලාභය යන ද්විත්වයෙන් වැඩි අගය මත පදනම්ව මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිශතයක සෙස් බද්දක් අය කළ හැකිය. කෙසේ වුවද, මෙම විකල්පය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය වැඩි කැමැත්තක් නොදැක්වූ අතර එහි ප්‍රතිඵලයක් සේ 2008 ජනවාරි 01 දින හෝ ඊට පසුව ක්‍රියාත්මක කිරීමට අනුමත කර තිබූ සෙස් බදු යෝජනාව 2008 ඔක්තෝබර් 07 දින ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලා අස්කරගන්නා ලදී.

## 11. කළමනාකරණ තොරතුරු පද්ධතියේ සංවර්ධනය පිළිබඳ තත්ත්වය

2015 වර්ෂය තුළදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් එහි සමාලෝචන කාර්යයන් වඩාත් ඵලදායී ලෙස සිදුකිරීම තහවුරු කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී. තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ නියෝජිත ආයතනය (ICTA) මෙම කාර්යය සඳහා පහසුකම් සපයන්නා ලෙස තොරාගනුලැබූ අතර, 2016/2017 වර්ෂය සඳහා එම නියෝජිත ආයතනයේ අයවැය ලේඛනයෙන් මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු පද්ධතියේ සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් වෙන්කර තිබිණි. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් ICTA ආයතනය සමඟ සහයෝගීත්වයෙන් වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලද අතර, අදාළ ව්‍යාපෘතිය, වැඩ සටහන් සම්පාදකයා වෙත ප්‍රදානය කරන මට්ටම දක්වා නිම කර තිබිණි. කෙසේවෙතත්, 2017 අවසාන කාර්තුවේදී ICTA ආයතනය, අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා දැරීමට සිදුවන වැය එම ආයතනය සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදනයෙන් කළ නොහැකි බව දැනුම් දී ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් තම පද්ධති සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් මූල්‍ය අවශ්‍යතාවයන් ලබාගැනීමට හැකි වන අවස්ථාවකදී, වෙනත් ආයතනයක් හරහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට, තම පද්ධති සංවර්ධන කටයුතු නැවත ආරම්භ කිරීමට සිදුව ඇත.

# 2017 වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ නිරීක්ෂණ

1. **අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා ලබාගත් එකඟතාවන්**

මූල්‍ය ප්‍රකාශනයන්හි නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හතකින් එකඟතාවන් ලබාගෙන ඇත. මෙම එකඟතාවයන් හේතුවෙන් ශුද්ධ ලාභයට/ස්කන්ධයට වූ නිවැරදි කිරීම්වල වටිනාකම රුපියල් බිලියන 2.2 ක් විය.

තවදුරටත්, මණ්ඩලය විසින් එම මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය වන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව තම මූල්‍ය ප්‍රකාශන සකස් කරන මෙන් දන්වමින් රාජ්‍ය සංස්ථාවකට විධානයක් නිකුත් කරන ලදී. තවද, විගණකයා විසින් විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණන කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන්, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායකට තම මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කොට නැවත ප්‍රකාශයට පත් කරන ලෙස විධානයක් නිකුත් කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/ LKAS) සමග අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් නොකිරීම හේතුවෙන් එවැනි ආයතන සමඟ එකඟත්වය ලබාගත් අයිතම වර්ග පහත පරිදිවේ.

- පරිපාලක හා පරිපාලිත සමාගම් අතර ඇති කරගන්නා ලද පහසුකම් සලස්වා ගැනීම් වැරදි ආකාරයට නාමමාත්‍ර වත්කම් සේ හඳුනාගැනීම. (යොමුව LKAS 39 ඡේද 58 සහ LKAS 24 ඡේද 18 සහ 19)
- හානිකරණය පිළිබඳව සංඥාවන් පැහැදිලිව තිබියදී මූල්‍ය වත්කම්වල හානිකරණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් ඇතිකිරීමට අසමත්වීම. (යොමුව LKAS 39 ඡේද 58)
- ජීව විද්‍යාත්මක වත්කම් හඳුනාගැනීමට සහ ඒවා සාධාරණ අගය මත මිණුම්කරණය කිරීමට අසමත් වීම. (යොමුව LKAS 41 ඡේද 5 සහ 12)
- පරිපාලිත සමාගමේ ස්කන්ධය සම්බන්ධයෙන් ඇති පරිපාලකයේ අයිතිය වෙනස්වීම නිරූපණය කිරීමට අසමත්වීම. (යොමුව SLFRS 10 ඡේද 23)
- රක්ෂණ ගිවිසුම් නිසි පරිදි හඳුනාගැනීමට සහ වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණය ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම. (යොමුව SLFRS 04 උපලේඛන සහ උපලේඛන B හි ඡේද අංක 18 (g))
- විශ්‍රාම පාරිතෝෂික බැඳීම් පිළිබඳ වගකීම් හඳුනාගැනීමට අසමත්වීම. (යොමුව LKAS 19 ඡේද 67, 71 සහ 72, සු.ම.ව්‍යා.සඳහා වූ SLFRS හි කොටස් අංක 28 හි ඡේද අංක 28.15)
- ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අයභාරය, විකුණුම් පිරිවැය සහ තොග හඳුනාගැනීමේදී නිම කළ ප්‍රතිශත ක්‍රමය භාවිතා කිරීමට අසමත්වීම. (යොමුව සු.ම.ව්‍යා.සඳහා වූ SLFRS හි කොටස් අංක 23 හි ඡේද අංක 23.21-23.27)

2. **උපකාරක ලිපි**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම් ප්‍රමාණාත්මක වුව ද නීතිමය විධිවිධාන යටතේ ක්‍රියා කිරීමට තරම් වැදගත් නොවන අවස්ථාවල එවැනි අනුකූල නොවීම් පිළිබඳව එම ව්‍යවසායයන්ට අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර ගැනීමට ඔවුන්ට හැකිවන පරිදි දීර්ඝ ලෙස විමර්ශනය නොකර ලිපි මගින් දැනුම් දෙනු ලැබේ. එවැනි ලිපි ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කරන නියමයන් නොවන අතර ඒවා උපකාරක ලිපි ලෙස නිකුත් කෙරේ.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් වෙත උපකාරක ලිපි යැවීම සඳහා හේතුපාදක වූ ප්‍රධාන නිරීක්ෂණයන් පහත වේ.

- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 34 ක, මූල්‍ය වත්කම් හෝ සමූහයේ මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට විෂය බද්ධ සාක්ෂි පැවති නමුත් එක් එක් වාර්තාකරණ කාලච්ඡේද අවසානයේදී හානිකරණය සඳහා වූ ප්‍රමාණවත් වෙන්කිරීමක් සිදුකිරීමට අසමත්වීම. (යොමුව LKAS 39 ඡේද 58)
- සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර 03 ක් සහිතව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 29 ක, සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන්ගේ ස්වභාවය මෙන්ම සම්බන්ධිත පාර්ශවයන් සමග කල ගණුදෙනු හා බැඳුනු තොරතුරු පිළිබඳව ප්‍රමාණවත් අනාවරණයන් කිරීමට අසමත්වීම. (යොමුව LKAS 24 ඡේද 18 සහ සු.ම.ව්‍යා.සඳහා වූ SLFRS හි කොටස් අංක 33 හි ඡේද අංක 33.9 සහ 33.10)
- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 25 ක් භාවිතා කරන ලද තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම, තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම සඳහා වූ යෙදවුම්, භාවිතා කල නිරීක්ෂණය කළ නොහැකි සැළකිය යුතු යෙදවුම් සඳහා වන ප්‍රමාණාත්මක තොරතුරු, යෙදවුම් සඳහා සිදුකරන ලද සැළකිය යුතු ගැලපීම් සහ සාධාරණ අගයට මිණුම්කරණය කරන ලද එක් එක් වත්කම් සහ බැරකම් පන්ති පිළිබඳව ප්‍රමාණාත්මක අනාවරණයන් කිරීමට අපොහොසත්වීම. (යොමුව SLFRS 13 ඡේද 91 සහ 93)
- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 16 ක්, තම ව්‍යාපාර ඒකක නිරාවරණය වී ඇති මූල්‍ය උපකරණ වලින් ඇතිවිය හැකි අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණයන් පිළිබඳව වාර්තාකරණ කාලච්ඡේදයේ අවසාන දිනට ප්‍රමාණවත් අනාවරණයන් කිරීමට

# 2017 වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ නිරීක්ෂණ

අසමත්වීම. (යොමුව SLFRS 07 ඡේද 31, 36 සහ 37)

- සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර 02 ක් සහිතව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 15 ක් විසින් විලම්භිත බදු බැරකම් හඳුනාගැනීමේදී සියළුම බදු වන තාවකාලික වෙනස්කම් සැළකිල්ලට ගැනීමට අසමත්වීම. (යොමුව LKAS 12 ඡේද 15, 20 සහ 24 සහ සු.ම.ව්‍යා.සඳහා වු SLFRS හි කොටස් අංක 29 හි ඡේද අංක 29.15)

- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 09 ක්, දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය බලපැවැත්වෙන දිනය, ප්‍රත්‍යාගණනයේදී භාවිතා කළ ක්‍රමය සහ සැළකිය යුතු උපකල්පනයන් සහ දේපළ, පිරියත හා උපකරණ පිරිවැය ආකෘතිය යටතේ අගය කරන ලද්දේ නම්, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුව තිබු ධාරණ අගය වැනි කරුණු පිළිබඳව ප්‍රමාණවත් අනාවරණයන් කිරීමට අසමත්වීම. (යොමුව LKAS 16 ඡේද 77)

- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 09 ක්, ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල සාධාරණ අගය ඒවායේ ධාරණ අගයන්ගෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට නිරන්තර ප්‍රත්‍යාගණනයක් ක්‍රියාත්මක කිරීමට අසමත්වීම. (යොමුව LKAS 16 ඡේද 34)

# 2017 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන්

1. **දන්කොටුව පෝසිලේන් පොදු සමාගම**

දන්කොටුව පෝසිලේන් පොදු සමාගම සහ එහි පරිපාලකය අතර වූ සම්බන්ධිත පාර්ශව එකඟත්වයක් මත නාමමාත්‍ර වත්කමක් සේ හදුනාගත යුතු අයිතමයක් 2014 මාර්තු 31 සහ 2015 මාර්තු 31 දායින් අවසන් වර්ෂවල මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය ව්‍යුත්පන්න වත්කමක් සේ හඳුනාගැනීම හේතුවෙන් එහි වත්කම් සහ ස්කන්ධය අධි ගණනය කර තිබිණි.

මෙම කරුණ මත විගණකයින් විසින් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර නොතිබිණි.

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මේ සම්බන්ධයෙන් කළ විමර්ශනයේ ප්‍රතිඵලයක් ලෙස 2017 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 260 ක් වූ එම අගය වත්කම් වලින් හා අනුරූප ලෙස ස්කන්ධයෙන් අඩුකොට පෙන්වීමට එකඟතාවය පළ කරන ලදී.

2. **චීෂියා කැපිටල් පොදු සමාගම**

චීෂියා කැපිටල් පොදු සමාගම 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා තම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එහි පරිපාලිතයක වූ චිත්‍රපට තොගයක වටිනාකම ඒවායේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් අඩු අගයට නිරූපණය නොකිරීම හේතුවෙන් සමූහයේ ශුද්ධ වත්කම් රු.මිලියන 502 කින් අධි ගණනය කොට පෙන්වා තිබිණි.

අලෙවි නොවන එම චිත්‍රපට තොග යෙහි ප්‍රතිඵලයක් ලෙස පරිපාලිත සමාගමෙන් (ඉහතින් සඳහන් කරන ලද චිත්‍රපට තොගය හිමි) ලැබිය යුතු අගය එහි ආපසු අයකරගත හැකි අගයට නිරූපණය කිරීමටද අසමත් වී තිබිණි.

මෙම කරුණු මත විගණකයින් විසින් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර තිබිණි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මේ පිළිබඳව කළ විමර්ශනය අනුව 2017 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සමාගමේ තොග යෙහි ධාරණ අගය අඩු කිරීමටත් අදාළ පරිපාලිතයෙන් ලැබිය යුතු දැ ලෙස නිරූපණය කර ඇති අගයෙන් හානිකරණය සඳහා වෙන්කිරීමක් තනිව සකස් කරන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමටත් එකඟත්වය පල කරන ලදී.

3. **සිංහපුත්‍ර ෆිනෑන්ස් පොදු සමාගම**

2016 මාර්තු 31 දායින් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සිංහපුත්‍ර ෆිනෑන්ස් පොදු සමාගම LKAS 39 හි අවශ්‍යතාවයන්ට අනුකූලව ණය හා ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් වන හානිකරණ වෙන් කිරීම තක්සේරු කිරීමට අසමත්වී තිබිණි. ඒ අනුව, 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ණය හා ලැබිය යුතු ශේෂය අධි ගණනය වී තිබිණි.

මෙම කරුණ මත විගණකයින් විසින් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර තිබිණි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මේ පිළිබඳව කළ විමර්ශනය අනුව 2017 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී LKAS 39 හි නිර්දේශිත ආකාරයට ණය හා ලැබිය යුතු දෑ පිළිබඳව හානිකරණ ඇගයීමකින් පසු රු.මිලියන 362 ක් පොත්වලින් කපා හැරීමට එකඟවූ අතර, පසුකාලීනව කෙරෙන ගණනය කිරීම් වලින් ද අවශ්‍ය වන කපා හැරීම් සිදු කිරීමට එකඟ වන ලදී.

4. **ජනශක්ති පොදු සමාගම**

i. **ආයෝජන දේපළ**

ජනශක්ති පොදු සමාගම විසින් එහි තේක්ක වගාව සහ අදාල ඉඩම 2016 මාර්තු 31 දායින් අවසන් වර්ෂය සඳහා ආයෝජන දේපළක් ලෙස පිරිවැයට මිණුම්කරණය කොට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබිණි.

මෙම කරුණ මත විගණකයින් විසින් ඔවුනගේ මතය තත්ත්වාගණනය කර නොතිබිණි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මේ පිළිබඳව කළ විමසීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2017 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී තේක්ක වගාව සහ එම ඉඩම වෙන්කොට හඳුනාගැනීමටත් තේක්ක වගාව සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන පිරිවැය අඩු කළ අගයට මිණුම්කරණය කොට නිරූපණය කිරීමටත් එකඟ වන ලදී.

ii. **පරිපාලිතයක් අපහරණය කිරීම**

සමාගමේ පරිපාලිත සමාගමක මුළු කොටස් අයිතියම තවත් පරිපාලිත සමාගමක් විසින් අත්පත් කරගැනීමේ ප්‍රතිඵලය, ජනශක්ති පොදු සමාගම විසින් අදාළ පරිපාලිතයේ වූ පරිපාලකයේ ඇල්මෙහි වෙනස්වීම සේ හඳුනාගෙන තිබුනු අතර, එහි ප්‍රතිඵලයක් සේ පරිපාලිත සමාගම අපහරණයෙන් ලද ලාභයක් වශයෙන් රු. මිලියන 524 ක් සහ කීර්තිනාම අගය රුපියල් මිලියන 564 ක් 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර තිබිණි.

මෙම කරුණ මත විගණකයින් විසින් ඔවුනගේ මතය තත්ත්වාගණනය කර නොතිබිණි.

# 2017 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන්

පසුකාලීනව ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මේ පිළිබඳව කළ විමසීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2017 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පරිපාලිතයේ වූ පරිපාලකයේ ඇල්මෙහි වෙනස්වීම සෘජුවම ස්කන්ධයට ගැලපීම් කිරීමටත් පෙරදී හඳුනාගන්නා ලද අපහරණ ලාභය සහ රු. මිලියන 564 ක් ලෙස හඳුනාගන්නා ලද කීර්තිනාමය ප්‍රතිවර්ත්‍ය කිරීමටත් එකඟ වන ලදී.

## 5. රාජ්‍ය මුද්‍රණ සංස්ථාව

රාජ්‍ය මුද්‍රණ සංස්ථාව 2015 දෙසැම්බර් 31 දායින් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී තම විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීමේදී ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කිරීමට සහ සංස්ථාවේ අවුරුදු 05 කට වඩා අඩු සේවා කාලයක් සහිත සේවකයින් වෙනුවෙන් විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන කිරීමට අසමත් වී තිබිණි.

තවදුරටත්, 2015 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සියළුම අඩු කල හැකි/බදු වන තාවකාලික වෙනස්කම් මත විලම්භිත බදු වත්කම/විලම්භිත බදු බැරකම හඳුනාගැනීමට අසමත් වී තිබිණි.

මෙම කරුණ මත විගණකයින් විසින් ඔවුනගේ මතය තත්ත්වාගණනය කර නොතිබිණි.

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මේ පිළිබඳව කළ විමසීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2016 දෙසැම්බර් 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම ගණනය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කිරීමටත් තම සියළුම සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා ප්‍රතිපාදනය කිරීමට සහ 2016 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා සියළුම අඩු කල හැකි/බදු වන තාවකාලික වෙනස්කම් මත විලම්භිත බදු වත්කම/විලම්භිත බදු බැරකම හඳුනාගැනීමට එකඟතාවය පළ කරන ලදී.

## 6. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව 2016 දෙසැම්බර් 31 දායින් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ණය රක්ෂණ ගිවිසුම් රක්ෂණ ගිවිසුම් සේ හෝ මූල්‍ය ඇප ගිවිසුම් සේ ගිණුම්ගත කිරීමට අසමත් වී තිබිණි.

මෙම කරුණ මත විගණකයින් විසින් ඔවුනගේ මතය තත්ත්වාගණනය කර නොතිබිණි.

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මේ පිළිබඳව කළ විමසීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2018 දෙසැම්බර් 31 දායින් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල නිර්යාත ණය රක්ෂණ ගිවිසුම්, රක්ෂණ ගිවිසුම් සේ හඳුනාගැනීමටත් අදාළ බැරකම් පිළිබඳව ප්‍රමාණාත්මතා පරීක්ෂණය සිදු කිරීමටත් එකඟතාවය පළ කරන ලදී.

## 7. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී.ල.ග.ම) නිසි පොත්පත් සහ ගිණුම් පවත්වාගෙන නොතිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී.ල.ග.ම 2013 දෙසැම්බර් 31 දායින් අවසන් වර්ෂය සඳහා එහි විගණිත ගිණුම් සත්‍ය හා සාධාරණ පරිදි ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබිණි.

මෙම කරුණ මත විගණකයින් විසින් එම මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් ඉදිරිපත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේදී හඳුනාගන්නා ලද කරුණුවල ප්‍රමාණාත්මකභාවය හේතුවෙන් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් ශ්‍රී.ල.ග.ම, ආයතනයේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කිරීමේ අරමුණ සහිතව නිසි පොත්පත් සහ ගිණුම් පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළුම පියවරයන් ගත යුතු බවට විධානයක් නිකුත් කරන ලදී.

## 8. ස්පෑන් ඉන්ජිනියරින් (පෞද්ගලික) සමාගම

ස්පෑන් ඉන්ජිනියරින් (පෞද්ගලික) සමාගම විසින් 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඉදිකරමින් පවතින නිවාස සංකීර්ණ හා බැදුනු ආදායම, විකුණුම් පිරිවැය සහ තොග නිම කරන ලද ප්‍රතිශත ක්‍රමය පාදකව හඳුනාගැනීමට අපොහොසත් වී තිබිණි.

තවද, සමාගම විසින් 2016 මාර්තු 31 දිනට වර්ෂ 5 කට වඩා අඩු සේවා කාලයක් සහිත සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන හඳුනාගැනීමට අසමත් වී ඇති අතර, 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය තුළදී එළඹුන සම්බන්ධිත පාර්ශව ගණුදෙනු පිළිබඳව අවම අනාවරණයන් ඉදිරිපත් කිරීමට අසමත් වී තිබිණි.

මෙම කරුණු මත විගණකයින් විසින් ඔවුනගේ මතය තත්ත්වාගණනය කර නොතිබිණි.

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මේ පිළිබඳව කළ විමසීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2017 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී තම ඉදිකෙරෙමින් පවතින නිවාස මත වූ ආදායම, විකුණුම් පිරිවැය සහ තොගය නිම කරන ලද ප්‍රතිශත ක්‍රමය පාදකව හඳුනාගැනීමටත් සියළුම සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් හඳුනාගැනීමටත්, සම්බන්ධිත පාර්ශව ගණුදෙනු පිළිබඳව අවශ්‍ය අනාවරණයන් කිරීමටත් එකඟත්වය පළ කරන ලදී.

# 2017 වර්ෂය තුළ විගණන පරීක්ෂණයේ නිරීක්ෂණ

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම) 2017 වර්ෂය තුළදී විගණනයන් හි ගුණත්වය වර්ධනය කිරීම අරමුණුගත කරගන්නා ලද අතර, එහි පරීක්ෂණ ක්‍රමවේදය වෙනස්කරමින්, වඩාත් අවදානම් පාදක ප්‍රවේශයක් අනුග මනය කරන ලදී.

නව ප්‍රවේශය ආරම්භ වන්නේ නිරීක්ෂණ කණ්ඩායම විසින් අදාළ කර්මාන්තය, ව්‍යාපාරය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව කරනු ලබන විස්තරාත්මක ඇගයීමක් තුළින් වඩාත් අවදානම් ක්ෂේත්‍රයන් හඳුනාගැනීමත් සමගයි. විගණන ගුණත්වය වර්ධනය කිරීම සඳහා මූලාරම්භයක් වශයෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම මෙම අවදානම් පාදක පරීක්ෂණ ප්‍රවේශය 2016 අවසාන කාර්තුවේදී ආරම්භ කරන ලදී. අදාළ අවදානම් හඳුනාගැනීමෙන් පසු පරීක්ෂණ විෂය පථය ගැඹුරු පරීක්ෂාවක් පවත්වාගෙන යාම සඳහා සීමා කරනු ලැබේ. නව ප්‍රවේශය අරමුණුගත කරන්නේ, විගණන පරීක්ෂණ ක්‍රමවේද හා ගෝලීය විගණන නියාමකයින් අනුගමනය කරන පරිචයන් හා අනුරූප වන ආකාරයටයි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම, මෙම වෙනස් කරන ලද අවධාරණය තවදුරටත් ඉදිරියට ගෙන යමින් 2017 වර්ෂයේදී තේමාමය පරීක්ෂණ ආරම්භ කල අතර, විගණන කිහිපයක තෝරාගන්නා ලද තේමාවන් පාදකව ගැඹුරු පරීක්ෂාවන් සිදු කරන ලදී.

2016 වර්ෂය තුළදී ධාරිතා සංවර්ධනය සඳහා ලැබුණු මූල්‍ය සහයෝගිතා ප්‍රදානය යටතේ විදේශීය උපදේශකයෙක් යොදාගනිමින් සේවකයින්ට ලබාදුන් පුහුණුව, විගණන පරීක්ෂාවන්හි මෙම වෙනස්කම් සහ තේමාමය පරීක්ෂාවන් ක්‍රියාත්මක කිරීම සඳහා උපකාර විය.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම, 2017 වර්ෂය තුළදී විගණන ආයතන 13 ක් විසින් සිදුකරන ලද විගණන 100 ක් පරීක්ෂාවට භාජනය කළ අතර, මෙය ඊට පෙර වර්ෂයේදී විගණන ආයතන 14 ක් විසින් සිදු කරන ලද විගණන 99 හා අනුරූප වේ. වර්ෂය තුළදී කරන ලද විගණන 100 සංයුක්ත වන්නේ විගණන පරීක්ෂණ 85 කින් සහ තේමාමය පරීක්ෂණ 15 කිනි. වර්ෂය තුළදී සිදු කරන ලද විගණන පරීක්ෂා වලින් 75 ක් අන්තර්ජාතික ජාලයන්හි සාමාජිකත්වය සහිත විගණන ආයතන 5 ක් විසින් කරන ලද ඒවා වන අතර, තවත් විගණන 5 ක් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් (නි.ව්‍යා.ව්‍ය.) 10 කට වඩා අඩුවෙන් කරනු ලබන විගණන ආයතන 5 ක් විසින් කරන ලද විගණනයි.

සමාලෝචන වලින් අනාවරණය වන සොයාගැනීම් ප්‍රමාණාත්මක වුවත් තවදුරටත් නීතිමය පියවර ගැනීමට තරමේ අනුකූලනොවූ අවස්ථාවන් වූ විට එවැනි ආයතන සඳහා උපකාරක ලිපි මඟින් අදාළ දැනුවත් කිරීම් කරන ලදී. කෙසේවෙතත්, සොයාගැනීම්වල ප්‍රබලතාවය අනුව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වඩාත් දැඩි පියවර ගත් අතර, එවැනි පියවරයන් ලෙස ආයතන වෙත අවවාදාත්මක ලිපි නිකුත් කිරීම, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවධානයට යොමු කිරීම සහ තම මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කොට නැවත ප්‍රකාශයට පත් කරන ලෙස නි.ව්‍යා.ව්‍ය. වෙත විධානයන් නිකුත් කිරීම ආදිය දැක්විය හැකිය. විගණන කර්මාන්තය පුරා විගණනවල ගුණත්වය උසස්කරලීම පරමාර්ථයෙන් වූ මෙම ක්‍රියාවලියේදී සමහරක් ආයතන වෙත තවදුරටත් සංවර්ධනය කරගත යුතු ක්ෂේත්‍ර පිළිබඳව සන්නිවේදනය කරන ලදී.

## 2. නැවත විගණනය සඳහා විධානයන්

විගණන පරීක්ෂණයන් සිදු කිරීමේදී හඳුනාගන්නා ලද අනුකූළ නොවීම්වල ප්‍රමාණාත්මකභාවයේ ප්‍රතිඵලයක් ලෙස, ඔවුනගේ මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරන ලෙස දන්වා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් 2017 වර්ෂය තුළදී නි.ව්‍යා.ව්‍ය. 02 ක් වෙත විධානයන් නිකුත් කරන ලදී. මෙම නි.ව්‍යා.ව්‍ය. විසින් නැවත විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කොට ඒවායේ පිටපත් එම වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ලැබී තිබුනු සියළුම පාර්ශවයන් වෙත ලබාදිය යුතු විය.

එලෙස විධානයන් නිකුත් කර ඇති නි.ව්‍යා.ව්‍ය. පහත දැක්වේ.

### 2.1 ඇඩම් කැපිටල් පොදු සමාගම

ඇඩම් කැපිටල් පොදු සමාගමේ විගණක, ඒ.අයි.මාකන් මාර්කර් සමාගම 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂයේදී විගණනය සම්බන්ධයෙන් කළ පරීක්ෂාවේ සොයා ගැනීම් වලට එකඟ නොවීම සහ විගණකයා එවැනි අනුකූල නොවීම් සඳහා තම කාර්යපත්‍රිකා මඟින් තහවුරුවක් ලබාදීමට අසමත්වීම හේතුවෙන්, මණ්ඩලය සමාගම වෙත විධානයක් නිකුත් කරමින් එම මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කළ යුතු බව දැනුම් දී ඇත. කෙසේවෙතත්, එවැනි නැවත විගණනයක් සඳහා දැරීමට සිදුවන පිරිවැය පිළිබඳව ගැටළුවක් පැන නැගී ඇති හෙයින් මෙහිදී විගණකයා පිළිබඳව ගතයුතු පියවර සම්බන්ධයෙන් උපදේශයක් ලබාගැනීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත.

### 2.2 ෆෙයාවේ හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගම

2016 මාර්තු 31 දායින් අවසන් වර්ෂය සඳහා ෆෙයාවේ හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගමේ විගණනය පිළිබඳව කරන ලද පරීක්ෂාවේදී අදාළ විගණකයා එනම්, නුසිත් කුමාරතුංග සහ සමාගම එම විගණනය ප්‍රමාණවත් වෘත්තීය නිපුණතාවයක් සහ මනා සැළකිල්ලක් සහිතව සිදුකිරීමට අසමත්වී ඇති බව අනාවරණය විය. විගණකයා වෙත එම අනුකූල නොවීම දැනුම්දීමෙන් පසු එය පිළිගෙන ඇති අතර, එවැනි අඩුපාඩුකම් නියාමනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුම් දී ඇත. කෙසේවෙතත්, අවනිදේශනයන් හි ප්‍රමාණාත්මකභාවය සැළකිල්ලට ගෙන මණ්ඩලය විසින් 2016 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කොට නැවත ප්‍රකාශ කළ යුතු බවට විධානයක් සමාගම වෙත නිකුත් කර ඇත.

# 2017 වර්ෂය තුළ විගණන පරීක්ෂණයේ නිරීක්ෂණ

## 3. පෙර වර්ෂයේදී නිකුත් කරන ලද විධානයන් පිළිබඳව පසු විපරම් පියවරයන්

**අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම**

2014 මාර්තු 31 දායින් අවසන් වූ වර්ෂයේ අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පොදු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදුන් විධානය පරිදි හුලුගල්ල සමරසිංහ සහ සමාගම විසින් එම විගණන ආයතනයේ වෙනත් කාර්යභහාර හවුල්කරුවෙක් මඟින් නැවත විගණනය කොට මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශයට පත් කළ අතර, එම මූල්‍ය ප්‍රකාශන සඳහා පෙරදී නිකුත් කර තිබූ තත්ත්වාගණනය නොකල විගණන මතය වෙනුවට, විගණන මතය වියාචනය කරමින් විගණන වාර්තාව ඉදිරිපත් කර තිබිණි. මෙහිදී සමාගම් පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් අවශ්‍ය නීති උපදෙස් නීතිපතිවරයාගෙන් ඉල්ලා ඇති අතර, විගණකයාගේ විෂමාචාරය පිළිබඳව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයට දැනුම් දී ඇත.

## 4. විගණන පරීක්ෂාවන් තුළින් මතුවූ නිරීක්ෂණයන්

විගණන ආයතන 13 ක් විසින් සිදුකරන ලද විගණන 43 ක අඩුපාඩුකම් හඳුනාගන්නා ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලින් බැහැරවීම් පිළිබඳව අදාළ ආයතන වෙත උපකාරක ලිපි මඟින් සන්නිවේදනය කර ඇත.

ප්‍රධාන නිරීක්ෂණයන් පහත පරිදි වේ.

### 4.1 ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට අසමත්වීම

තහවුරු කිරීමේ පටිපාටිය සහ පාලන පරීක්ෂණ මඟින් විගණන 32 ක මූල්‍යප්‍රකාශන සැඳවුම් තහවුරු කිරීම සඳහා උපකාරක වන ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන නොතිබිණි.

ඌණතාවයන්ට ඇතුළත් වූ දෑ:

- බැංකු සමඟ ඇති ශේෂ, ඒකාබද්ධ ගැලපුම්, ප්‍රතිවර්තය, ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම්, ණය, විවිධ ආදායම්, පරිපාලිතයන්හි ආයෝජන, ණය හා ලැබිය යුතු දෑ හානිකරණය සඳහා වෙන් කිරීම් සහ අසම්භව්‍ය බැරකම් වැනි මූල්‍ය ප්‍රකාශනවල සැඳවුම් පරීක්ෂාව සඳහා කිසිදු විගණන ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීමට අසමත් වීම.
- ඇතැම් මූල්‍ය ප්‍රකාශන සැඳවුම් පරීක්ෂාව සඳහා කිසිදු විගණන ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීමට අසමත්වීම.

උදාහරණ :

- විශේෂඥයාගේ නිරීක්ෂණයන්හි හෝ නිගමනයන්හි අදාළභාවය සහ අනිකුත් විගණන සාක්ෂි සමඟ ඒවායේ අනුරූපතාවය සැළකිල්ලට ගෙන කළමනාකරණ විශේෂඥයාගේ කාර්යභාරයෙහි යෝග්‍යතාවය ඇගයීමට විගණන පටිපාටියක් අනුගමනය නොකිරීම.
- සමාගම විසින්  එහි දේපළ, පිරියත හා උපකරණ තක්සේරු කිරීම සඳහා යොදවා ගන්නා ලද තක්සේරුකරුගේ නිපුණතා සුදුසුකම් හි යෝග්‍යතාවය නිශ්චය කිරීමට අසමත්වීම.
- අදාළ දේපළ වලින් අනාගතයේදී ව්‍යාපාරය තුළට ගලා එන ආර්ථික ප්‍රතිලාභයන්ගේ අවිනිශ්චිතතාවයක් පිළිබඳව සංඥාවක් තිබියදීත්, එය නොසළකා ආයෝජන දේපළවල අගය නිසි පරිදි නිශ්චය කිරීමට අසමත්වීම.
- සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ශේෂ පිළිබඳව ලබාගන්නා ලද තහවුරු කිරීමේ ලිපිවල සහ කළමනාකරණ නියෝජනය අතර නොඑකඟතාවයන් විසදාගනිමින් නිරවද්‍යභාවය සහ සම්පූර්ණත්වය තහවුරු කිරීමට අවශ්‍ය විගණන පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට අසමත්වීම.
- ගණුදෙනුකරු විසින් සම්පූර්ණ මුදල ගෙවා තිබියදීත් දේපළ, ඔප්පු පවරා නොදීමට හේතු ඇගයීම සඳහා අවශ්‍ය විගණන පිළිවෙත් ක්‍රියාත්මක කිරීම මගින් දේපළ සංවර්ධන සමාගමක් විසින් වාර්තා කර ඇති විකුණුම්වල නිරවද්‍යභාවය සහ සම්පූර්ණත්වය තහවුරු කිරීමට අසමත්වීම.
- ප්‍රාථමික වෙළඳ මෙහෙයුම් ආයතනයක ප්‍රතිවර්ත්‍ය ප්‍රති මිලදී ගැණුම් සහ ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් කාල පරිච්ඡේදය පුරා සුරැකුම් විභජනය හා නැවත විභජනය පිළිබඳව නිරවද්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත්වීම.

- තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් පාදකව අභ්‍යන්තර විගණකගේ වැඩ කටයුතු පිළිබඳව තහවුරුවක් ලබාගැනීමේදී, අභ්‍යන්තර විගණකවරයාට අදාළ තොරතුරු තාක්ෂණ පොදු පාලන ක්‍රමය පිළිබඳව ඇති නිපුණතාවය සහ එහි විෂය පථය පරීක්ෂා කිරීමේදී අනුගමනය කළ යුතු විගණන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමට අසමත්වීම.
- ගිණුම් ශේෂ පිළිබඳව සැළසුම් කර තිබූ තහවුරු කිරීමේ විගණන පටිපාටි ක්‍රියාත්මක නොකිරීම.
- විගණන සාක්ෂි වලින් ප්‍රමාණාත්මක අවනිදේශනයක් නිරූපණය කර තිබියදීත්, අතිරේක විගණන පද්ධති ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම.
- විවිධ මූලාශ්‍ර වලින් ලබාග න්නා ලද විගණන සාක්ෂි වල අසමානතාවයන් නිරාකරණය සඳහා තවදුරටත් සිදුකළ යුතු විගණන ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක නොකිරීම.

### 4.2 මූල්‍ය ප්‍රකාශන විගණනයේදී වංචාවන් පිළිබඳ අවදානම සම්බන්ධයෙන් වූ විගණකගේ වගකීම ඉටු කිරීමට අසමත්වීම

විගණන 16 කදී වංචා පිළිබඳව අවදානම හා සම්බන්ධව අවධාරණය යොමු කිරීමට විගණකයා අසමත්වී තිබිණ.

# 2017 වර්ෂය තුළ විගණන පරීක්ෂණයේ නිරීක්ෂණ

ඌණතාවයන්ට ඇතුළත් වූ දෑ:

- ජර්නල් සටහන් ලෙජරයට ඇතුළත් කිරීමේදී වංචාවන් සිදුවීමේ අවදානම පිළිබඳව වඩාත් යෝග්‍ය වූ පරීක්ෂාවක් සඳහා විගණන පටිපාටි ක්‍රියාත්මක කිරීමට අසමත්වීම.

උදාහරණ :

- ජර්නල් සටහන් පටිපාටිය හා සම්බන්ධිත වෘත්තීය සංශයවාදය පවත්වාගෙන යෑමට අසමත්වීම.
- පාලන පරීක්ෂාවන් හි කොටසක් සේ ජර්නල් සටහන් අනුමත කිරීමට බලය ලබාදෙන පුද්ගලයාගේ යෝග්‍යතාවය පිළිබඳව ඇගයීමක් නොකිරීම.
- ජර්නල් සටහන් මඟින් වංචා ඇතිවීමේ අවදානම පරීක්ෂා කිරීමට අසමත්වීම.
- ගුණාත්මක ලක්ෂණ පාදකව වංචනික ජර්නල් සටහන් සේ සැළකිය හැකි ජර්නල් සටහන් නියැදියක් තෝරාගැනීමට අපොහොසත්වීම.
- පෙරදාතම සහිත ජර්නල් සටහන් හා සම්බන්ධිත අවදානම් සංඥාවන් හඳුනාගැනීම සඳහා මනා සැළකිල්ලක් යොමු කිරීමට විගණකයා අසමත් වීම.
- කාලච්ඡේදය තුළදී අස්ථිත්වය විසින් අනුමත කරන ලද ජර්නල් සටහන් පිළිබඳව පරීක්ෂාවක් කිරීමට අසමත්වීම.
- ජර්නල් සටහන් සම්බන්ධව අනුගමනය කළ යුතු විගණන ක්‍රියාපටිපාටියේ විෂය පථය, ස්වභාවය, කාලය සහ ප්‍රමාණය හඳුනාගැනීමට අසමත් වීම.

- එවැනි අවදානමක් ඇති බව විගණකයා විසින් හඳුනාගත්තත් එය සැළකීමකින් තොරව, අනුගමනය කළ යුතු විගණන පටිපාටියේ ප්‍රමාණය තීරණය කිරීමේදී කළමනාකරණය විසින් පාලන වලින් බැහැරව කටයුතු කිරීමේ අවදානම සැළකිල්ලට ගැනීම අසමත් වීම.
- අයභාරය සම්බන්ධව පවතින වංචනික අවදානම් පිළිබඳව උපකල්පනය කිරීම සැළකිල්ලට ගැනීම අසමත්වීම.

## 4.3 තක්සේරු කරන ලද අවදානම් සඳහා ප්‍රතිචාර දැක්වීමට අසමත්වීම

විගණන ආයතන 11 ක් හඳුනාගන්නා ලද අවදානම් සඳහා යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමට අසමත්වී ඇති බව අනාවරණය විය.

ඌණතාවයන්ට ඇතුළත් වූ දෑ:

- තොරතුරු තාක්ෂණ විගණකයින් විසින් හඳුනාගන්නා ලද පාලන අවදානම් මත ඇතිවිය හැකි ඌනතාවයන් පිළිබඳව ඇගයීමක් කිරීමට අසමත් වීම.
- පාලන පරීක්ෂාවන් විගණන උපාය මාර්ගයන්හි කොටසක් ලෙස ඇතුළත් කර ඇතත්, පාලන පරීක්ෂාවන් ක්‍රියාත්මක කිරීමට අසමත්වීම.
- පාලන පරීක්ෂාවන් ක්‍රියාත්මක කිරීමේදී තීරණාත්මක පාලනයන් හඳුනාගැනීමට අසමත්වීම.
- අති විශේෂ අයිතමයන් හා සම්බන්ධිත අතිරේක විගණන ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක නොකිරීම.
- පාලන පරීක්ෂාවන් හි ප්‍රතිපල සතුටුදායක නොවන අවස්ථාවන්හීදී පාලන පරීක්ෂාවන් හා සමානව තහවුරු කිරීමේ විගණන ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම.
- පාලන පරීක්ෂාවන් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කිරීම හැරෙන්නට ප්‍රධාන ක්‍රියාකාරකම් මත පාලනයන්හි මෙහෙයුම් කාර්යක්ෂමතාවය සඳහා සාක්ෂි ලබාගැනීමට අසමත්වීම.

## 4.4 සාධාරණ අගය මත වූ ගිණුම්කරණ ඇස්තමේන්තු සහිතව ගිණුම්කරණ ඇස්තමේන්තු පරීක්ෂා කිරීමට සහ අදාළ අනාවරණයන් කිරීමට අසමත්වීම.

විගණන පරීක්ෂණ 11 කදී අදාළ ආයතනවල කළමනාකරණය විසින් ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කරන ලද්දේ කෙසේද යන්න සහ එවැනි ඇස්තමේන්තු සඳහා පාදකවූ දත්තයන්වල යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට අසමත්වී ඇති බව අනාවරණය විය.

ඌණතාවයන්ට ඇතුළත් වූ දෑ:

- ව්‍යාපාර සංයෝජනය මත හඳුනාගන්නා ලද කීර්තිනාමය ඇස්තමේන්තුකරණය සම්බන්ධව විගණන පටිපාටි ක්‍රියාත්මක කිරීමට අසමත්වීම.
- ඉතා ඉහළ අවිනිශ්චිතතාවයක් පැවතිය හැකි ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා භාවිතා කරන ලද විනිශ්චයන් තක්සේරු කිරීමට අසමත්වීම.
- වත්කම්වල සාධාරණ අගය නිශ්චය කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරන ලද වැදගත් උපකල්පනයන් සහ භාවිතා කරන ලද යෙදවුම්වල සාධාරණත්වය ස්වාධීනව ඇගයීමට හා තක්සේරු කිරීමට විගණකයා අසමත්වීම.
- ණය හා ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් සමූහ පදනම මත හානිකරණය ගණනය කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය සහ කළමනාකරණය විසින් භාවිතා කරන ලද උපකල්පනයන් සාධාරණද යන්න අගය කිරීමට විගණකයා අසමත්වීම.
- ණය හා ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් සමූහ පදනම මත හානිකරණය ගණනය කිරීමේදී කල්පසුවූ ණය වලින් ඇතිවූ අලාභ අනුපාතය ගණනය කිරීම සඳහා යෙදවුම් වශයෙන් සමාගම් විසින් භාවිතා කරන ලද ප්‍රභව දත්තයන්වල සම්පූර්ණත්වය තහවුරු කිරීමට විගණකයා අසමත්වීම.
- පරිභෝජනය කළ හැකි ජීව වත්කම් අගය කිරීමේදී භාවිතා කරන ලද අගය කිරීමේ ආකෘතිය මඟින් වර්තමාන වෙළඳපල අගයන් නිරූපණය වන බව තහවුරු කෙරෙන පරිදි ක්‍රමාංකනය පරීක්ෂා කිරීමට අසමත්වීම.

# 2017 වර්ෂය තුළ විගණන පරීක්ෂණයේ නිරීක්ෂණ

**4.5 ප්‍රමාණාත්මක අවනිදේශන අවදානම ඇගයීම හා අවබෝධ කරගැනීම හා සම්බන්ධයෙන් අනුකූල නොවීම.**

විගණන 8 කදී ප්‍රමාණාත්මක අවනිදේශනයන් හඳුනාගැනීම සහ ඇගයීම හා සම්බන්ධ අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

ඌණතාවයන්ට ඇතුළත් වූ දෑ:

- තොරතුරු තාක්ෂණ පද්ධතිය සහිත මූල්‍ය වාර්තාකරණයේදී අදාළ වන සම්බන්ධිත ව්‍යාපාර ක්‍රියාවලි අවබෝධ කරගැනීමට විගණන පටිපාටි ක්‍රියාත්මක කිරීමට අසමත්වීම.
- වඩා අවධානය යොමු කර පුළුල් විගණන ක්‍රියාපටිපාටියක් අනුගමනය පිණිස සියළුම අවදානම් තුළින් ඇතිවිය හැකි සැලකිය යුතු අවදානම් හඳුනාගැනීමට අසමත්වීම.
- වර්ෂ අවසානයේ ඇති අත ඉතිරි මුදල් ශේෂයේ සැළකිය යුතු වැඩිවීමක් වැනි ප්‍රමාණාත්මකව විශේෂ විගණන සැළකිල්ලක් අවශ්‍ය වන අවදානම් දර්ශකයන් හඳුනාගැනීම සඳහා වෘත්තීය නිපුණතාවය භාවිතා කිරීමට අසමත්වීම.
- මූල්‍ය වර්ෂය තුළ දී තොරතුරු තාක්ෂණ පද්ධතියේ සිදුකරන ලද වෙනස්කම් ඇගයීමක් සිදුකිරීමට අසමත්වීම.
- මූල්‍ය ප්‍රකාශන සැඳවුම් හා සම්බන්ධ ප්‍රධාන අභ්‍යන්තර පාලනයන් හඳුනාගැනීමේදී සහ ඒවායේ වලංගුභාවය තීරණය කිරීමේදී වෘත්තීය විනිශ්චය භාවිතා කිරීමට අසමත්වීම.

**4.6 තත්ත්ව පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සහ පවත්වාගෙන යාමට අසමත්වීම.**

විගණන කටයුතුවල නියැලීමේදී යෝග්‍ය තත්ත්ව පාලන ක්‍රම භාවිතා කරන ලද්දේද යන්න පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කිරීමට විගණන 06 කදී අසමත්භාවයක් දක්වා ඇත.

ඌණතාවයන්ට ඇතුළත් වූ දෑ:

- අදාළ විගණන කටයුතු හා සම්බන්ධයෙන් ඉතා ඉහළ විගණන අවදානමක් පැවතියත්, තත්ත්ව පාලන සමාලෝචකයෙකු පත් නොකිරීම.
- විගණනය ලැයිස්තුගත සමාග මක් හා සම්බන්ධයෙන් වුවත් සැළසුම් කිරීමේදී, විගණනය පවත්වාගෙන යාමේදී සහ සම්පූර්ණ කිරීමේදී තත්ත්ව පාලන සමාලෝචකයෙකුගේ ප්‍රමාණවත් සහයෝගය ලබා නොගැනීම.
- විගණන කණ්ඩායම විසින් සිදු කරන ලද සැලකිය යුතු වෙනස්කම් සහ එළැඹි නිගමන පිළිබඳ වාස්තවික ඇගයීමක් තත්ත්ව පාලක සමාලෝචකයා විසින් සිදු නොකිරීම.
- ඉහළ අවදානමක් සහිත විගණන ක්ෂේත්‍රයන් විගණන වාර්තාවේ සඳහන් දිනයෙන් පසු දිනක සමාලෝචනය කිරීම.
- විගණනය සඳහා භාවිතා කරන ලද කාල උපයෝජනය පිළිබඳව වාර්තා අනුව හා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් සොයාගන්නා ලද විගණන ප්‍රමිතීන් හා අනුකූලව කටයුතු නොකිරීම පිළිබඳව වූ නිරීක්ෂණයන් අනුව විගණනය මෙහෙයවීම, අධීක්ෂණය සහ ක්‍රියාවට නැංවීමේදී විගණනයේ කාර්යභාර හවුල්කරු විසින් වැයකරන ලද කාලය ප්‍රමාණවත් නොවීම.

**4.7 විගණනයේදී නියැදි තෝරාගැනීමේ පදනම පිළිබඳව සාක්ෂි නොමැතිවීම**

විගණන නියැදිකරණයේදී විගණන ආයතන 6 ක් විසින් සිදු කර ඇති අනුකූල නොවීම් හඳුනාගන්නා ලදී.

ඌණතාවයන්ට ඇතුළත් වූ දෑ:

- නියැදිකරණයේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට අපොහොසත්වීම.
- විගණන ක්‍රියාපටිපාටියේ අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා උචිත විගණන සාක්ෂි රැස්කරගැනීම පිණිස අවශ්‍ය වන පරීක්ෂාවන් සඳහා නියැදි තෝරාගැනීමේ පදනම තහවුරු කිරීමට අපොහොසත්වීම.
- සමූහයේ සෑම ඒකකයක් සඳහාම නියැදිවලට ඇතුළත් වීම සඳහා අවකාශය ලබා නොදීම මගින් නිසි පරිදි නියැදි තෝරාගැනීමට අපොහොසත්වීම.
- ලේඛනගත කරන ලද නියැදි තෝරාගැනීමේ ක්‍රමවේදයට පටහැනි ලෙස නියැදි තෝරාගැනීම.
- තෝරාගන්නා ලද නියැදියේ සෑම අයිතමයක්ම සම්බන්ධයෙන්ම යෝග්‍ය විගණන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමට අපොහොසත් වීම.
- සමූහය සම්බන්ධයෙන් නිගමනයකට එළැඹීමේදී භාවිතා කරන ලද නියැදි ඒ සඳහා සාධාරණ පදනමක් සැපයුවාද යන්න නිශ්චය කිරීමේ පරමාර්ථයෙන් නියැදි ප්‍රතිඵල ඇගයීමකට අපොහොසත්වීම.

**4.8 අනෙකුත් නිරීක්ෂණ**

- ඇතැම් විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණක් වූයේ මූල්‍ය ප්‍රකාශන සමස්ථයක් ලෙස, වංචා හෝ දෝෂ හේතුවෙන්, ප්‍රමාණාත්මක අවනිදේශනයන්ගෙන් තොරවීම හා ඒ හේතුවෙන් විගණකයාට තම මතය ප්‍රකාශ කිරීමේදී මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ ආකෘතිය යටතේ, මූල්‍ය ප්‍රකාශන සියළුම ප්‍රමාණාත්මක අංගයන්ට අනුකූල වන පරිදි සකස් කර ඇති බවට තහවුරුවක් ලබාගැනීම සඳහා විගණකයා අසමත්වී ඇති බවයි.
- ඇතැම් විගණන වලදී, විගණකයා විසින් මුළු විගණනය පුරාම වෘත්තීය සැළකිලිමත්භාවය පවත්වාගෙන යාමට සහ විගණන මතය කෙටුම්පත් කිරීමේදී මනා සැළකිල්ල යොමු කිරීමට අසමත් වී ඇති බව පැහැදිලි විය.

# 2017 වර්ෂය තුළ විගණන පරීක්ෂණයේ නිරීක්ෂණ

- හඳුනාගන්නා ලද පොදු අඩුපාඩුකම් අතර අපේක්ෂිත සැඳහුම් තෝරාගැනීම සඳහා වඩාත් යෝග්‍ය විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටියක් සැළසුම් කිරීමට අපොහොසත් වීම සහ විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි මඟින් තෝරා ගන්නා ලද අංශ පිළිබඳව අතිරේක විගණන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් හඳුනාගන්නා ලද විචලනයන් පරීක්ෂා කිරීමට අපොහොසත් වීම යනාදිය අයත් වේ.
- සමූහ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී හඳුනාගන්නා ලද පොදු නිරීක්ෂණයන් අතරට ඒකාබද්ධ ගැලපුම් හා අදාළ විගණන සාක්ෂි ලබාගැනීමට අපොහොසත්වීම සහ පරිපාලිතයන් හී මූල්‍ය ප්‍රකාශන සඳහා දී ඇති මතය පිළිබඳව ලබාගන්නා ලද විගණන සාක්ෂිවල අප්‍රමාණවත්භාවය අයත්වේ. තවද, සංරචක විගණකයාගෙන් ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාග ැනීමට අපොහොසත්වී ඇති අතර, සංරචක විගණකයා විසින් සන්නිවේදනය කරන ලද තොරතුරු ඇගයීමට අපොහොසත් වී ඇත.
- ඒ හා සමානව සැළසුම් අවදියේ සිට විගණන ලිපි ගොනුව ඒකරාශී කරන අවස්ථාව දක්වා නිසි පරිපාලන ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකිරීම හේතුවෙන් ලිපි ගොනුව ඒකරාශී කිරීම, රහස්‍යභාවය ආරක්ෂා කිරීම, සුරක්ෂිතභාවය, අවංකභාවය, කාර්යපත්‍රිකා සඳහා ප්‍රවේශ වීම, නැවත ඒවා ස්ථාපිත කිරීම යනාදී අංශ පිළිබඳව පැහැදිලි අඩුලුහුඩුකම් නිරීක්ෂණය කරන ලදී.
- සම්බන්ධිත පාර්ශව සම්බන්ධතා සහ ගනුදෙනු නිසියාකාරව හඳුනාගෙන ගිණුම්ගත කර තිබේ ද සහ / හෝ ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කර තිබේද යන්න පිළිබඳ ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ඇතැම් විගණකවරුන් ලබාගෙන නොතිබිණි.

## 5.0 වැඩි දියුණු කිරීම සඳහා වූ යෝජනා

අනාගත විගණනයන්හී වැඩි දියුණු කිරීම ධෛර්‍යමත් කිරීම සඳහා විගණන 13 ක් වෙනුවෙන් විගණන ආයතන 4 ක් සඳහා වැඩි දියුණු කිරීමේ යෝජනා ලබාදී ඇත.

## 6.0 අවවාදාත්මක ලිපි

පරීක්ෂණ දිනයට පසුව වූ දාතම සහිත ලේඛන ඉදිරිපත් කිරීම මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය හිතාමතාම නොමඟ යැවීම හේතුවෙන් වර්ෂය තුළදී විගණකයෙකු වෙත අවවාදාත්මක ලිපියක් නිකුත් කරන ලදී.

## 7.0 තේමාමය පරීක්ෂණ

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් තත්ත්ව පාලන සමාලෝචකයෙකු නියුක්ත කිරීම සහ ආයතනික පාලනයට වගකිව යුත්තන් හා සන්නිවේදනය යන තේමා යටතේ විගණන ආයතන 6 ක් නියෝජනය වන පරිදි නියැදි ලෙස තෝරාගන්නා ලද විගණන 15 ක් පිළිබඳව තේමාමය පරීක්ෂණ පවත්වාගෙන යන ලදී. ඒවා මත ලැබෙන නිරීක්ෂණ වාර්තාව 2018 වර්ෂයේදී නිකුත් කරනු ලැබේ.

## 8.0 විගණන ආයතන තුල තත්ත්ව පාලන පරීක්ෂණ

2018 මුල් භාගයේදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විගණන ආයතන තුල තත්ත්ව පාලන පරීක්ෂාවක් කිරීමට සැලසුම් කර ඇත. 2017 වර්ෂය තුළදී සේවක මණ්ඩලය විගණන ආයතන තුල සිදුකෙරෙන තත්ත්ව පාලන පරීක්ෂාවන් සඳහා අවශ්‍ය විස්තරාත්මක සැළසුම්, ප්‍රශ්නාවලි සහ ආකෘති සකස් කිරීමේ කාර්යයේ නියුක්ත විය.

2016 වර්ෂයේදී සේවක මණ්ඩලය වෙත, එක්සත් රාජධානියේ, විගණන නියාමනයන් පිළිබඳව ප්‍රායෝගික පළපුරුද්ද සහිත, අන්තර්ජාතික උපදේශකයෙක් මඟින් ලබාදුන් විස්තීර්ණ පුහුණුව තුළින් ලද දැනුම හා නිරාවරණය මෙවැනි වැඩසටහනක් පහසුකරලීමට හේතුවිය. සියළුම විගණන ආයතන සඳහා මෙවැනි තත්ත්ව පාලන පරීක්ෂණයක් අනිවාර්ය කිරීම හා බැඳුනු නීතිමය සංශෝධන ඇති කරන තෙක් ස්වෙච්ඡාවෙන්ම එවැනි තත්ත්ව පාලන පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් වන විගණන ආයතනවල මුලින්ම තත්ත්ව පාලන පරීක්ෂණය පවත්වාගෙන යනු ලැබේ. විගණන පරිසරය තුළ විගණන ගුණත්වය වර්ධනය කිරීමට එවැනි විගණන ආයතන ලබාදෙන සහභාගීත්වය අගය කිරීම සඳහා එවැනි ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන විගණන ආයතන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රසිද්ධියට පත් කරන අතර, එම විගණන ආයතන සඳහා වෙන වෙනම වාර්තා ලබාදීමක් සිදුකිරීමට අපේක්ෂා කරයි.

# කාර්යය සාධන ලකුණු පත

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි වාර්ෂික කාර්ය සාධන සැලසුම් සකස්කිරීම පිණිස කාර්ය සාධන ලකුණු පත්‍ර භාවිතා කරනු ලැබේ. 2017 සැලැස්ම, 2017 තත්‍ය සටහන හා 2018 සඳහා වන සැලැස්ම පහත දක්වා ඇත.

**මූල්‍ය ප්‍රකාශන පරිශීලක දෘෂ්ටිකෝණය:** *අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන් අපව දැකිය යුත්තේ කෙසේද?*

| ඉලක්කය | ක්‍රියාමාර්ගය | 2017 සැලැස්ම (සංශෝධිත) | 2017 තථ්‍ය සටහන | | 2018 සැලැස්ම |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලැස්මේ ප්‍රතිශතයක් ලෙස | |
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්හී මූල්‍ය ප්‍රකාශනවලින් සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිබිඹු කිරීම | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා අනුකූලතාවය නිශ්චය කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම | මූල්‍ය ප්‍රකාශන කට්ටල 511 | මූල්‍ය ප්‍රකාශන කට්ටල 518 | 101 | මූල්‍ය ප්‍රකාශන කට්ටල 525 |
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණන කාර්යභාරයන් සිදුකර ඇත්ද යන්න පරීක්ෂා කිරීම | විගණන 100 (තේමාමය පරීක්ෂණ 15 ක් සහිතව) | විගණන 100 (තේමාමය පරීක්ෂණ 15 ක් සහිතව) | 100 | විගණන 100 (තේමාමය පරීක්ෂණ 15 ක් සහිතව) විගණන 4 ක ආයතන පුරා තත්ත්ව පරීක්ෂණය |

**නියාමනයට භාජනය වූ ආයතන දෘෂ්ටිකෝණය :** අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා නියාමනයට භාජනය වූ ආයතන අපව දැකිය යුත්තේ කෙසේද?

| ඉලක්කය | ක්‍රියාමාර්ගය | 2017 සැලැස්ම | 2017 තථ්‍ය සටහන | | 2018 සැලැස්ම |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලැස්මේ ප්‍රතිශතයක් ලෙස | |
| මූල්‍ය ප්‍රකාශන එක්රැස් කිරීම | ලැබුණු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 1,559 | 1,479 නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය සංඛ්‍යාව 1,643 (මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව) **(සටහන 1)** | 94.9 | 1,559 |

# කාර්යය සාධන ලකුණු පත

**අභ්‍යන්තර ක්‍රියාවලි දෘෂ්ටිකෝණය:** *අපගේ පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීමට අප කුමන අභ්‍යන්තර ක්‍රියාවලියක් සම්බන්ධයෙන් විශිෂ්ටත්වයක් දැක්විය යුතුද?*

| ඉලක්කය | ක්‍රියාමාර්ගය | 2017 සැලැස්ම | 2017 තථ්‍ය සටහන | | 2018 සැලැස්ම |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලැස්මේ ප්‍රතිශතයක් ලෙස | |
| සේවක කාර්ය සාධනය | වර්ෂය සඳහා ඉලක්කගත කාර්ය සාධන ලකුණු ළඟාකර ගැනීම **(සටහන 2)** | 29,484 | 28,719 | 97 | 28,296 |
| දැනුම වර්ධනය කරගනිමින් වර්තමාන මෙහෙවර ඉලක්කයන් ළඟාකර ගැනීමට ඇති බාධක ඉවත් කිරීම | සතිපතා කෙරෙන ඉගෙනුම් ක්‍රියාකාරකම් (අභ්‍යන්තර) | ප්‍රමිති පිළිබඳ ඉදිරිපත්කිරීම් 48 | 48 **(සටහන 3)** | 100 | 48 |
| කාලානුරූප ප්‍රතිචාර | ලැබුණු පැමිණිලි, ඉල්ලීම් කරන ලද පැහැදිලි කිරීම් සහ ලැබුණු තොරතුරු පිළිබඳව කටයුතු කිරීම | ලැබුනු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර සාමාන්‍ය වශයෙන් දින 5 ක් ඇතුලත | ලැබුනු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර දින 3.4 | - | ලැබුනු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර සාමාන්‍ය වශයෙන් දින 5 ක් ඇතුලත |

**සටහන 01**
ගන්නා ලද පසුවිපරම් ක්‍රියාමාර්ග හේතුවෙන් පෙර වර්ෂ සඳහා අදාළ මූල්‍ය ප්‍රකාශන මෙම වර්ෂයේදී ලැබීම.

**සටහන 02**
කාර්යභාරය නිම කිරීම සඳහා අවශ්‍ය වන වැඩ කොටසෙහි ස්වභාවය හා ප්‍රමාණය පාදකව කාර්යසාධන ලකුණු තීරණය කරනු ලැබේ. ගැටළුවේ සංකීර්ණතාවය සහ ඇතිවිය හැකි ගැටළුවල ප්‍රතිඵලයක් සේ තාක්ෂණික සාකච්ඡා සඳහා වැඩි කාලයක් ගත විය හැකිය.

**සටහන 03**
බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනය විසින් පවත්වනු ලැබූ පුහුණුවීමේ සැසි සහ මහා පරිමාණ විගණන ආයතන 6 විසින් කරනු ලබන ක්‍රමවේදය පිළිබඳව ඉදිරිපත් කිරීම් සඳහා සහභාගීත්වය මෙයට අයත්වේ.

# 2017 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBE's) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 1 | අබාන්ස් ඉලෙක්ට්‍රිකල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 2 | අබාන්ස් ෆිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 3 | අබාන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 4 | ඇක්සස් එන්ජිනියරින් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 5 | ඒ සී එල් ප්ලාස්ටික් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 6 | ඒ සී එල් ප්ලාස්ටික් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 7 | ඇක්මී ප්‍රින්ටින්ග් ඇන්ඩ් පැකේජින් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 8 | ඇක්යුට් සෙකියුරිටීස් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 9 | ඇක්යුට් ස්ටොක්බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 10 | ආගරපතන ප්ලාන්ටේෂන්ස් සමාගම | 2017 මාර්තු 31 |
| 11 | ඇගියෝ ටොබැකෝ ප්‍රොසෙසින්ග් කම්පැනි (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 12 | ඒ අයි ඒ ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 13 | ඒයිට්කන් ස්පෙන්ස් හොටෙල් හෝල්ඩින්ග්ස් සමාගම | 2017 මාර්තු 31 |
| 14 | එයිට්කන් ස්පෙන්ස් සමාගම | 2017 මාර්තු 31 |
| 15 | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 16 | අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 17 | ඇලුෆැබ් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 18 | ඇලුමෙක්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 19 | අමානා කැන්ඩෝ ෂරියා බැලැන්ස්ඩ් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 20 | අමානා කැන්ඩෝ ෂරියා ඉන්කම් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 21 | අමානා කැපිටල් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 22 | අමානා තකාෆුල් ලයිෆ් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 23 | අමානා තකාෆුල් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 24 | අමානා තකාෆුල් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 25 | අමායා ලෙෂර් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 26 | ඒ එම් ඩබ් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 27 | ආර්පිකෝ ඇටරාෂියා ශ්‍රී ලංකන් බොන්ඩ් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 28 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 29 | ඒෂියා ඇසෙට්ස් ෆයිනෑන්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 30 | ඒෂියා සියාකා කොමොඩිටීස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 31 | ඒෂියන් අලයන්ස් ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 32 | ආසිරි හොස්පිටල් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 33 | ආසිරි සර්ජිකල් හොස්පිටල් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 34 | ආසිරි සර්ජිකල් හොස්පිටල් පොදු සමාගම | 2016 මාර්තු 31 |

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 35 | ඇසෙට්ලයින් ලීසිං සමාගම | 2017 මාර්තු 31 |
| 36 | ඇසෙට්ලයින් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 37 | ඇස්ට්‍රෑ ඇල්ෆා ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 38 | ඇස්ට්‍රෑ ගිල්ට් එජ්ඩ් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 39 | ඇස්ට්‍රෑ මනී මාර්කට් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 40 | බයිරහා ෆාම්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 41 | ලංකා බැංකුව | 2016 දෙසැම්බර් 31 |
| 42 | බෙන්තොට රෝයල් රිසෝට් හික්කඩුව පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 43 | බාර්ට්ලීට් රෙලිගෙයා සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 44 | බ්ලූ ඕෂන් රෙසිඩන්සීස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 45 | බෝගල ග්‍රැෆයිට් ලංකා පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 46 | බී පී පී එල් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 47 | බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 48 | බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 49 | බ්‍රිටිෂ් ඕවර්සීස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 50 | බ්‍රවුන්ස් බීච් හොටෙල් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 51 | බ්‍රවුන්ස් කැපිටල් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 52 | බ්‍රවුන්ස් හයිඩ්‍රො පවර් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 53 | සී එම් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 54 | සී ටී රියල් එස්ටේට් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 55 | කැන්ඩෝ ඉක්විටීස් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 56 | කැන්ඩෝ ග්රෝත් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 57 | කැන්ඩෝ මනී මාර්කට් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 58 | කැපිටල් එලයන්ස් ගිල්ට් ෆන්ඩ් | 2017 මාර්තු 31 |
| 59 | කැපිටල් එලයන්ස් බැලන්ස්ඩ් ෆන්ඩ් | 2017 මාර්තු 31 |
| 60 | කැපිටල් එලයන්ස් කෝපරේට් ඩෙබිට් ඇන්ඩ් ගිල්ට් ට්‍රේඩින්ග් ෆන්ඩ් | 2017 මාර්තු 31 |
| 61 | කැපිටල් එලයන්ස් කෝපරේට් ට්‍රෙෂරි ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 62 | කැපිටල් එලයන්ස් ගිල්ට් මනි මාර්කට් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 63 | කැපිටල් එලයන්ස් ගිල්ට් ට්‍රේඩින්ග් ෆන්ඩ් | 2017 මාර්තු 31 |
| 64 | කැපිටල් එලයන්ස් හයි යීල්ඩ් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 65 | කැපිටල් එලයන්ස් ඉන්කම් ෆන්ඩ් | 2017 මාර්තු 31 |
| 66 | කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ග්‍රේඩ් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 67 | කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් සමාගම | 2016 මාර්තු 31 |
| 68 | කැපිටල් එලයන්ස් සමාගම | 2017 මාර්තු 31 |
| 69 | කැපිටල් එලයන්ස් මීඩියම් රිස්ක් ඩෙට් ෆන්ඩ් | 2016 මාර්තු 31 |

# 2017 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBE's) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 70 | කැපිටල් චීලයන්ස් කොන්ට්‍රේට්ව් ඉක්යුටි ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 71 | කැපිටල් චීලයන්ස් සිකියුරිටීස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 72 | කාගිල්ස් බෑන්ක් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 73 | කාගෝ බෝට් ඩිවෙලොප්මන්ට් කම්පැනි සමාගම | 2016 මාර්තු 31 |
| 74 | කාගෝ බෝට් ඩිවෙලොප්මන්ට් කම්පැනි සමාගම | 2017 මාර්තු 31 |
| 75 | සියට් කැළනි රේඩියල්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 76 | සෙන්ට්‍රල් ඩිවෙලොප්මන්ට්ස් සමාගම | 2017 මාර්තු 31 |
| 77 | සෙන්ට්‍රල් ඉන්ඩ්‍රස්ට්‍රීස් සමාගම | 2017 මාර්තු 31 |
| 78 | සීබෑන්ක් ඇසෙස්ට් මැනේජ්මන්ට් සමාගම | 2016 මාර්තු 31 |
| 79 | සීබෑන්ක් සෙන්චරි ග්රෝත් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 80 | සීබෑන්ක් යුනිට් ට්‍රස්ට් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 81 | සිලෝන් ඇන්ඩ් ෆොරීන් ට්‍රේඩර්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 82 | සිලෝන් ඇන්ඩ් ෆොරීන් ට්‍රේඩර්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 83 | සිලෝන් ඇසෙස්ට් මැනේජ්මන්ට් කම්පැනි පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 84 | සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 85 | සිලෝන් ෆයිනෑන්ෂියල් සෙක්ටර් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 86 | සිලෝන් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 87 | සිලෝන් ගාර්ඩියන් ඉන්වෙස්ට්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ් | 2017 මාර්තු 31 |
| 88 | සිලෝන් ඉන්කම් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 89 | සිලෝන් ඉන්ඩෙක්ස් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 90 | සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 91 | සිලෝන් අයි පී ඕ ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 92 | සිලෝන් ලෙදර් ප්‍රොඩක්ට්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 93 | සිලෝන් ලෙදර් ප්‍රොඩක්ට්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 94 | සිලෝන් ෂිපින් කෝපර්රේෂන් සමාගම | 2015 මාර්තු 31 |
| 95 | සිලෝන් ටී බ්‍රෝකර්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 96 | ලංකා දුම්කොළ පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 97 | සිලෝන් ටුවරිසම් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 98 | චැව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 99 | සී අයි සී හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 100 | සී අයි සී හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 101 | සිටිසන්ස් ඩිවෙලොප්මන්ට්ස් බිස්නස් ෆිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 102 | සී එම් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 103 | කලම්බු ඩොක්යාඩ් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 104 | කලම්බු ෆෝට් ඉන්වෙස්ට්මන්ට්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 105 | කලම්බු ඉන්වෙස්ටමන්ට්ස් ට්‍රස්ට් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 106 | කලම්බු ස්ටොක් එක්ස්චේන්ජ් | 2016 දෙසැම්බර් 31 |
| 107 | කලම්බු ට්‍රස්ට් ෆයිනෑන්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 108 | කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 109 | කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 110 | කොමර්ෂල් ඩිවෙලොප්මන්ට් කම්පැනි පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 111 | කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 112 | කොම්ට්‍රස්ට් ඒ ඩී එල් මුදාරාහ්බාහ් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 113 | කොම්ට්‍රස්ට් ඇසෙස්ට් මැනේජ්මන්ට් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 114 | කොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 115 | කොම්ට්‍රස්ට් ගිල්ට් එජ්ඩ් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 116 | කොම්ට්‍රස්ට් මනී මාර්කට් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 117 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 118 | කන්වීනියන්ස් ෆුඩ්ස් (ලංකා) පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 119 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 120 | ක්‍රසන්ට් අයි ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 121 | සී ටී සී එල් සී ඒ සෙකියුරිටි (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 122 | සී ටී ලෑන්ඩ් ඩිවෙලොප්මන්ට් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 123 | ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 124 | ඩීසල් ඇන්ඩ් මෝටර් එන්ජිනියරින් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 125 | ඩිල්මා සිලෝන් ටී පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 126 | ඩිල්මා ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 127 | ඩිප්ට් ප්‍රොඩක්ට්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 128 | ඩොල්ෆින් හොටෙල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 129 | ඩුනාමිස් කැපිටල් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 130 | ඊස්ටන් මර්චන්ට් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 131 | ඊ-චැනලින් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 132 | ඊඩ්න් හොටෙල් ලංකා පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 133 | එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 134 | ඉක්විටි වන් සමාගම | 2017 මාර්තු 31 |
| 135 | ඉක්විටි ටු පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 136 | එක්ස්පො ලංකා හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 137 | ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 138 | ෆින්ලේස් කලම්බු සමාගම | 2016 දෙසැම්බර් 31 |

# 2017 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBE's) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 139 | ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම | 2016 මාර්තු 31 |
| 140 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 141 | ගෙස්ටෙටිනර් ඔෆ් සිලෝන් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 142 | ගාර්ඩියන් ඇක්විටි ඉක්විටි ෆන්ඩ් | 2016 දෙසැම්බර් 31 |
| 143 | ගාර්ඩියන් ඇක්විටි මනි මාර්කට් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 144 | ගාර්ඩියන් ඇක්විටි මනි මාර්කට් ගිල්ට් ෆන්ඩ් | 2016 දෙසැම්බර් 31 |
| 145 | ගාර්ඩියන් කැපිටල් පාර්ට්නර්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 146 | හරිස්චන්ද්‍ර මිල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 147 | හේකාබ් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 148 | හේලිස් ෆැබ්රික් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 149 | හේලිස් ෆයිබර් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 150 | හෙජස් කෝට් රෙසිඩන්සීස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 151 | එච් එන් බී ඇෂුවරන්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 152 | එච් එන් බී ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 153 | එච් එන් බී ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 154 | හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 155 | හුන්නස් ෆෝල්ස් හොටෙල් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 156 | අයි සී සී හවුසින් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 157 | අයිඩියල් ෆිනෑන්ස් සමාගම | 2016 මාර්තු 31 |
| 158 | අයිඩියල් ෆිනෑන්ස් සමාගම | 2017 මාර්තු 31 |
| 159 | ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිෂන් නෙට්වර්ක් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 160 | ඉසුරු ලීසිං සමාගම | 2016 මාර්තු 31 |
| 161 | ජේ එල් මොරිසන් සන් ඇන්ඩ් ජෝන්ස් (සිලෝන්) පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 162 | ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 163 | ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 164 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 165 | ජේ බී සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 166 | ජේ බී වැන්ටේජ් මනි මාර්කට් ෆන්ඩ් | 2016 දෙසැම්බර් 31 |
| 167 | ජේ බී වැන්ටේජ් වැලියු ඉක්විටි ෆන්ඩ් | 2016 දෙසැම්බර් 31 |
| 168 | ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 169 | ජෝන් කීල්ස් හොටෙල් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 170 | ජෝන් කීල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 171 | ජෝන් කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 172 | කහවත්ත ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 173 | කන්ඩලම හොටෙල්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 174 | කන්රිච් ෆයිනෑන්ස් සමාගම | 2016 මාර්තු 31 |
| 175 | කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 176 | කැළනි කේබල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 177 | කැළනි ටයර්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 178 | කැළනි වැලි ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 179 | කැළනි වැලි ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 180 | කෙල්සි ඩිවෙලොප්මන්ට්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 181 | කෙල්සි හෝම්ස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 182 | ලේක් හවුස් ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 183 | ලංකා ඇලුමිනියම් ඉන්ඩස්ට්‍රීස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 184 | ලංකා සෙරමික් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 185 | ලංකා සෙරමික් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 186 | ලංකා කොමොඩිටි හෝල්ඩින්ග්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 187 | ලංකා මිල්ක් ෆුඩ්ස් (සීඩබ්ඊ) පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 188 | ලංකා සෙකියුරිටි (පෞද්) සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 189 | ලංකා ටයිල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 190 | ලංකා වෙන්චර්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 191 | ලංකා වෝල්ටයිල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 192 | ලක්ෂපාන බැටරීස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 193 | එල් බී ෆිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 194 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 195 | ලයන් බෲවරි (සිලෝන්) පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 196 | එල් ඕ එල් සී ලයිෆ් ඇෂුවරන්ස් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 197 | මහවැලි රීච් හොටෙල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 198 | මල්වත්ත වැලි ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 199 | මල්වත්ත වැලි ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 200 | මල්වත්ත වැලි ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 201 | මාරවිල රිසෝට් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 202 | මතුරට ප්ලාන්ටේෂන්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 203 | එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් කම්පැනි සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 204 | මර්කන්ටයිල් ෂිපින්ග් කම්පැනි සමාගම | 2017 මාර්තු 31 |
| 205 | මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 206 | මිලේනියම් හවුසින් ඩිවෙලොපර්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 207 | එම් ටී ඩී වෝර්කර්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |

# 2017 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමග අනුකූලතාවය දක්වන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBE's) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 208 | මලර් ඇන්ඩ් ෆිජ්ස් (සිලෝන්) පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 209 | මල්ටි ෆයිනෑන්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 210 | නාමල් ඇකියුටි වැලියු ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 211 | නාමල් ගිල්ට් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 212 | නාමල් ග්‍රෝත් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 213 | නාමල් හයි යීල්ඩ් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 214 | නාමල් ඉන්කම් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 215 | නාමල් අයි පී ඕ ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 216 | නාමල් මනී මාර්කට් ෆන්ඩ් | 2017 මාර්තු 31 |
| 217 | නමුනුකුල ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 218 | නමුනුකුල ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 219 | නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 220 | නැෂනල් ඉක්විටි ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 221 | නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 222 | නැට්වේල්ත් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 223 | නාවරා සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 224 | එන් ඩී බී වෙල්ත් ගිල්ට්-එජ් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 225 | එන් ඩී බී ග්‍රෝත් ඇන්ඩ් ඉන්කම් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 226 | එන් ඩී බී වෙල්ත් ග්‍රෝත් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 227 | ඉන් ඩී බී වෙල්ත් ඉන්කම් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 228 | එන් ඩී බී වෙල්ත් ඉස්ලාමික් මනි ප්ලස් ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 229 | එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 230 | එන් ඩී බී වෙල්ත් මනී ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |
| 231 | එන් ඩී බී වෙල්ත් මනී ප්ලස් ෆන්ඩ් | 2016 දෙසැම්බර් 31 |
| 232 | නෙස්ලේ ලංකා පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 233 | නිව්වෙස්ට් කැපිටල් සමාගම | 2017 මාර්තු 31 |
| 234 | නිවාසි ඩිවෙලොපර්ස් මාළඹේ (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 235 | එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 236 | ඔෆිස් ඉක්විප්මන්ට් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 237 | ඔනලි හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 238 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 239 | ඔවර්සීස් රියලටි (සිලෝන්) පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 240 | පෑන් ඒෂියා බෑන්කින් කෝපර්රේෂන් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 241 | පෑන් ඒෂියන් පවර් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 242 | පීපල්ස් ඉන්ෂුවරන්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 243 | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 244 | පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 245 | පිරමල් ග්ලාස් සිලෝන් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 246 | ප්‍රින්ට්කෙයා පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 247 | ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 248 | පුස්සැල්ලාව ප්ලාන්ටේෂන්ස් සමාගම | 2016 මාර්තු 31 |
| 249 | ක්වීන්බයි ලංකා ප්‍රින්ටර්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 250 | රම්බොඩ ෆෝල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 251 | රෙග්නිස් (ලංකා) පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 252 | රේණුකා ඇග්රි ෆුඩ්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 253 | රේණුකා සිටි හොටෙල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 254 | රේණුකා ෆුඩ්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 255 | රේණුකා ෆුඩ්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 256 | රේණුකා ෆුඩ්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 257 | රිසස් එනර්ජි පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 258 | රිචඩ් පීරිස් එක්ස්පෝට් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 259 | රොක්ලන්ඩ් ඩිස්ටිලිරීස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 260 | රෝයල් පාම් බීච් හොටෙල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 261 | ආර් පී සී පොලිමර්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 262 | සම්පත් බෑන්ක් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 263 | සැම්සන් කොම්පවුන්ඩ්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 264 | සැම්සන් ඉන්ටර්නැෂනල් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 265 | සණස ඩිවෙලොප්මන්ට් බෑන්ක් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 266 | සතොස මෝටර්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 267 | එස් සී සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 268 | සෙලින්සින් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 269 | සෙලින්සින් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 270 | සෙන්කඩගල ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 271 | සෙරන්ඩිබ් එන්ජිනියරින් ගෲප් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 272 | සෙරන්ඩිබ් ෆයිනෑන්ස් සමාගම | 2016 මාර්තු 31 |
| 273 | සෙරන්ඩිබ් හොටෙල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 274 | සෙරන්ඩිබ් ලෑන්ඩ් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 275 | සෙලාන් බෑන්ක් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 276 | ෂාර්ලිමාර් (මැලේ) පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 277 | ෂාර්ලිමාර් (මැලේ) පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 278 | ෂෝර්ට් ටර්ම් එල් කේ ආර් ට්‍රෙෂරි ෆන්ඩ් | 2015 දෙසැම්බර් 31 |

# 2017 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBE's) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 279 | සිංගර් (ශ්‍රී ලංකා) පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 280 | සිංගර් ෆයිනෑන්ස් (ලංකා) පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 281 | සිංගර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන්) සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 282 | සිත්මා ඩිවෙලොප්මන්ට් (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 283 | සිත්මා ඩිවෙලොප්මන්ට් (පෞද්) සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 284 | සියපත ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 285 | එස් එම් බී ලීසිං පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 286 | එස් එම් බී සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 287 | සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 288 | සොෆ්ට්ලොජික් ස්ටොක්බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 289 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 290 | ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 291 | ස්ට්‍රෝම් මයික්‍රෝෆයිනෑන්ස් ඒෂියා (ගැරන්ටි) සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 292 | සුමිත් ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 293 | ස්වර්ණමහල් ෆයිනෑන්සියල් සර්විස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 294 | ස්විස්ටෙක් (සිලෝන්) පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 295 | ටී ඒ චල් ලංකා හොටෙල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 296 | තලවකැලේ ටී ස්ටේට් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 297 | ටැංජරින් බීච් හොටෙල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 298 | තැප්‍රොබේන් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 299 | ටී ස්මෝල්හෝල්ඩර් ෆැක්ටරීස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 300 | ටීජේ ලංකා පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 301 | ද ඔටෝඩ්‍රෝම් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 302 | ද ඔටෝඩ්‍රොම් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 303 | ද කලම්බු ෆෝට් ලෑන්ඩ් ඇන්ඩ් බිල්ඩින් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 304 | ද ෆෝට්රෙස් රිසෝට් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 305 | ද කැන්ඩි හොටෙල්ස් කම්පැනි (1938) පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 306 | ද කින්ග්ස්බරි පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 307 | ද ලංකා හොස්පිටල් කෝපරේෂන් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 308 | ද ලයිට් හවුස් හොටෙල් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 309 | ද නුවරඑළිය හොටෙල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 310 | ත්‍රී ඒකර් ෆාම්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 311 | ටී කේ එස් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 312 | ටෝකියෝ සිමෙන්ට් කම්පැනි (ලංකා) පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 313 | ට්‍රාන්ස් ඒෂියා හොටෙල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 314 | යු බී ෆිනෑන්ස් සමාගම | 2017 මාර්තු 31 |
| 315 | යූනියන් ඇෂුවරන්ස් ජෙනරල් සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 316 | යූනියන් ඇෂුවරන්ස් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 317 | යූනියන් කෙමිකල්ස් ලංකා පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 318 | යූනියන්ස් කැපිටල් ලීසිං සමාගම | 2017 මාර්තු 31 |
| 319 | යුනයිටඩ් මෝටර්ස් ලංකා පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 320 | විෂන් ෆන්ඩ් ලංකා සමාගම | 2016 මාර්තු 31 |
| 321 | වටවල ප්ලාන්ටේෂන් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 322 | වෝටර් ෆරන්ට් ප්‍රොපර්ටීස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 323 | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් සමාගම | 2017 මාර්තු 31 |
| 324 | යෝක් ආකේඩ් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |

# 2017 වර්ෂයේදී සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන අතරින් නිරීක්ෂණ සහිතව අනුකූල වූ, උපකාර ලිපි මගින් දැනුම් දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBE's) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය | දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 1 | ඒසීඑල් කේබල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 2 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය - ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | 2015 දෙසැම්බර් 31 |
| 3 | කෘෂි රක්ෂණ ක්‍රමය | 2016 දෙසැම්බර් 31 |
| 4 | ඇග්ස්ටාර් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 5 | ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 6 | ඒට්කන් ස්පෙන්ස් ප්ලාන්ටේෂන් මැනේජ්මන්ට් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 7 | අලියාන්ස් ෆිනෑන්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 8 | අලියාන්ස් ෆිනෑන්ස් සමාගම | 2016 මාර්තු 31 |
| 9 | අමානා බෑන්ක් පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 10 | ආර්පිකෝ ඇටරාක්ෂියා කෑෂ් මැනේජ්මන්ට් ෆන්ඩ් | 2016 මාර්තු 31 |
| 11 | ආර්පිකෝ ඇටරාක්ෂියා එස් ඇන්ඩ් පී එස් එල් 20 ඉන්ඩෙක්ස් අරමුදල | 2016 මාර්තු 31 |
| 12 | ආර්පිකෝ ෆිනෑන්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 13 | ඇස්කොට් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 14 | ආශා පිලිප් සෙකියුරිටීස් සමාගම | 2017 මාර්තු 31 |
| 15 | ඒෂියා කැපිටල් පොදු සමාගම | 2013 මාර්තු 31 |
| 16 | ඒෂියා කැපිටල් පොදු සමාගම | 2014 මාර්තු 31 |
| 17 | ඒෂියා සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 18 | ඒෂියන් හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපර්ටීස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 19 | ඇසෝසියේටඩ් මෝටර් ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 20 | ඇසෝසියේටඩ් මෝටර් ෆයිනෑන්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 21 | බලන්ගොඩ ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 22 | බේරුවල රිසෝට් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 23 | බිම්පුත් ෆයිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 24 | බිලු මවුන්ටන් ප්‍රොපර්ටීස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 25 | බොගවන්තලාව ටී ස්ටේට් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 26 | සී ටී ප්‍රොපර්ටීස් ලිමිටඩ් | 2016 මාර්තු 31 |
| 27 | සී ඩබ් මැකී පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 28 | බැන්ඩෝ ඇසෙට් මැනේජ්මන්ට් (පෞද්) සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 29 | කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2017 මාර්තු 31 |
| 30 | කාගිල්ස් (සිලෝන්) පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 31 | කාගිල්ස් (සිලෝන්) පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 32 | කාගිල්ස් (සිලෝන්) පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 33 | මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය | 2012 දෙසැම්බර් 31 |
| 34 | සෙලින්කෝ රක්ෂණ සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 35 | සෙලින්කෝ රක්ෂණ සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 36 | සෙලින්කෝ රක්ෂණ පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 37 | සෙලින්කෝ රක්ෂණ පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 38 | සෙලින්කෝ ජීවිත රක්ෂණ සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 39 | සෙලින්කෝ ජීවිත රක්ෂණ සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 40 | සී/ස ලංකා පොහොර සමාගම | 2016 මාර්තු 31 |
| 41 | සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 42 | ලංකා හොස්පිට්ල්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 43 | ලංකා හොටෙල්ස් කෝපරේෂන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 44 | වෙමෙනෙක්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 45 | සිටි හවුසින් ඇන්ඩ් රියල් ස්ටේට් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 46 | කෝපරේටිව් ලීසිං සමාගම | 2016 මාර්තු 31 |
| 47 | පොල් වගාකිරීමේ මණ්ඩලය | 2014 මාර්තු 31 |
| 48 | කලම්බු සිටි හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 49 | කෝප්ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | 2016 දෙසැම්බර් 31 |
| 50 | දන්කොටුව පෝසිලේන් පොදු සමාගම | 2014 මාර්තු 31 |
| 51 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2015 දෙසැම්බර් 31 |
| 52 | ඩයලොග් අසියාටා පොදු සමාගම | 2016 දෙසැම්බර් 31 |
| 53 | ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 54 | ඊ බී ක්‍රීසි ඇන්ඩ් කම්පැනි පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 55 | ඊස්ට් වෙස්ට් ප්‍රොපර්ටීස් පොදු සමාගම | 2017 මාර්තු 31 |
| 56 | ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 57 | සේවක භාරකාර අරමුදල් මණ්ඩලය | 2014 දෙසැම්බර් 31 |
